

# ශ්‍රී ලංකාවේ පරිවර්තනීය ආර්ථික වර්ධනය තිරසාර කිරීම 2025-2030

ODI Global සහ දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ (CEPA) අනුග්‍රහය යටතේ ස්වාධීන අධ්‍යයන කණ්ඩායමක් විසින් මෙම වාර්තාව සකසා ඇත.

ජූලි 2025

ODI Global

cepa
centre for poverty analysis

# ශ්‍රී ලංකාවේ පරිවර්තනීය ආර්ථික වර්ධනය තිරසාර කිරීම 2025-2030

ODI Global සහ දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ (CEPA) අනුග්‍රහය යටතේ ස්වාධීන අධ්‍යයන කණ්ඩායමක් විසින් මෙම වාර්තාව සකසා ඇත.

ජූලි 2025

ODI Global

cepa
centre for poverty analysis

පළමු මුද්‍රණය 2025
ODI Global
203 බ්ලැක්ෆයර්ස් පාර
ලන්ඩනය SE1 8NJ
එක්සත් රාජධානිය

© ODI 2025

මුල් සංස්කරණය: ODI Global (UK)
පිට කවර නිර්මාණය: ODI Global (UK)

පාඨකයින්ට මෙම වාර්තාවේ සඳහන් දෑ වාණිජ අරමුණු සඳහා භාවිතා නොකර තමන්ගේ ප්‍රකාශනවල ප්‍රතිනිෂ්පදනය කිරීමට උනන්දු කෙරේ. මාර්ගගත භාවිතය සඳහා, මුල් පිටපත ODI Global වෙබ් අඩවිය වෙතින් බාගත හැකිය. මෙම ප්‍රකාශනයේ අදහස් ලේඛකවරුන්ගේ අදහස් වන අතර ODI Global හෝ අපගේ හවුල්කරුවන්ගේ අදහස් නියෝජනය නොකෙරේ.

මෙම කෘතිය CC BY-NC-ND 4.0 යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇත.

යොමුගත කළ යුතු ආකාරය ODI Global සහ CEPA (2025) ශ්‍රී ලංකාවේ පරිවර්තීය වර්ධනය තිරසාර කිරීම 2025-2030. ODI Global වාර්තාව. ලන්ඩන්: ODI Global (https://www.odi.org/publications/sustaining-transformative-growth-in-sri-lanka-odi-cepa-growth-study-report)

# පූර්විකාව

මෙම වාර්තාව සිරිමල් අබේරත්න, චන්ද්‍රනාත් අමරසේකර, රවීන් බස්නායක, ඉන්ද්‍රජිත් කුමාරස්වාමි, ඉවට් ප්‍රනාන්දු, ඩර්ක් විලෙම් ටී වෙල්ඩේ, ඇසල වීරකෝන්, ෂියා වික්‍රමසිංහ සහ ගනේෂන් විග්නරාජා යන අය විසින් පිළියෙල කරන ලද්දකි. කොළඹ දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) සහ ලන්ඩනයේ ODI Global යන පර්යේෂණ ආයතන දෙකෙහි අනුග්‍රහය යටතේ ස්වාධීන අධ්‍යයන කණ්ඩායමක් විසින් මෙම ආර්ථික වර්ධනය පිළිබද වාර්තාව සකස් කර ඇත. මොවුන් ස්වාධීන අධ්‍යයන කණ්ඩායමක් පිහිටුවා ගත් අතර ගනේෂන් විග්නරාජා එහි කැදවුම්කරු විය.

මෙම ස්වාධීන අධ්‍යයන කණ්ඩායම රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය, අධ්‍යයන කණ්ඩායම්, ජාත්‍යන්තර මූල්‍ය ආයතන පිළිබඳ  අත්දැකීම් ඇති වෘත්තිකයන්ගෙන් සමන්විත වේ. ස්වාධීන අධ්‍යයන කණ්ඩායමේ සමාජිකයින් ඔවුන්ගේ පෞද්ගලික ධාරිතාවන්ගෙන් කටයුතු කර ඇති අතර ඔවුන්ගේ නිරීක්ෂණයන් ඔවුන් නියෝජනය කරන හෝ අනුබද්ධිත ව සිටි ආයතනවලට ආරෝපණය නොකළ යුතුය.

ස්වාධීන අධ්‍යයන කණ්ඩායමේ සාමාජිකයන්:

- **සිරිමල් අබේරත්න** (CEPA හි විධායක අධ්‍යක්ෂ සහ කොළඹ විශ්ව විද්‍යාලයේ සම්මානිත මහාචාර්ය),
- **චන්ද්‍රනාත් අමරසේකර** (සහකාර අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව),
- **රවීන් බස්නායක** (කළමනාකාර අධ්‍යක්ෂ/CITI දේශීය නිලධාරී, ශ්‍රී ලංකාව),
- **ඉන්ද්‍රජිත් කුමාරස්වාමි** (ශ්‍රී ලංකා මහ බැංකුවේ හිටපු අධිපති සහ පොදුරාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලයේ ආර්ථික කටයුතු අංශයේ හිටපු අධ්‍යක්ෂ),

- **ඉවට් ප්‍රනාන්දු** (ශ්‍රී ලංකා මහ බැංකුවේ හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති),
- **ඩර්ක් විලෙම් ටී වෙල්ඩේ** (ODI Global හී ජාත්‍යන්තර ආර්ථික සංවර්ධන කණ්ඩායමේ අධ්‍යක්ෂ සහ ලන්ඩනයේ SOAS විශ්ව විද්‍යාලයේ මහාචාර්ය).
- **ඇසල වීරකෝන්** ( දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංවිධානය (SAARC) හි හිටපු මහලේකම්, ශ්‍රී ලංකාවේ හිටපු විදේශ ලේකම් සහ හිටපු ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්),
- **ෂියා වික්‍රමසිංහ** (CBL සමූහයේ සමූහ කළමනාකාර අධ්‍යක්ෂ),
- **ගනේෂන් විග්නරාජා** (ස්වාධීන අධ්‍යයන කණ්ඩායමේ කැඳවුම්කරු, ODI Global ජ්‍යෙෂ්ඨ පර්යේෂක, ශ්‍රී ලංකාවේ විදේශ අමාත්‍යාංශයේ අධ්‍යයන කණ්ඩායමේ හිටපු විධායක අධ්‍යක්ෂ සහ ADB හි පර්යේෂණ ආයතනයේ හිටපු අධ්‍යක්ෂ)
- ලේකම් කාර්යාලයට අනිෂ්කා ද සිල්වා, ඇන්ජෙලා කොලොන්ගෝ, ක්‍රිස්ටීන් මාෂා සහ ෂෙරිලින් රාගා යන අය ඇතුළත් විය.

**"ශ්‍රී ලංකාව - ණයගැතිභාවයෙන් වර්ධනයට"** නම් ODI Global ලිපි ඇතුළත් ග්‍රන්ථය සහ එහි දෙවන සංස්කරණය (2025 අප්‍රේල් මාසය දක්වා සිදුවීම් සඳහා යාවත්කාලීන කරන ලද) මත ස්වාධීන අධ්‍යයන කණ්ඩායම සිය අධ්‍යනය සිදුකර ඇත.
**www.odi.org/publications/sri-lanka-fromdebt-default-to-transformative-growth-second-edition** මෙම වාර්තාව සකස් කිරීම සඳහා 2025 ජනවාරි සිට ජුනි දක්වා කාලය තුළ ස්වාධීන අධ්‍යයන කණ්ඩායම පස් වතාවක් රැස්විය.

මෙම කාර්යය සාර්ථක කරගැනීම සඳහා බොහෝ පුද්ගලයින් සහ ආයතනවල අදහස්, යෝජනා සහ එකතුකිරීම් රැසක් අධ්‍යයන කණ්ඩායම වෙත ලැබුණු අතර එම ප්‍රතිචාර දැක්වූ ව්‍යාපාරික සංගම්, විශ්ව විද්‍යාල, රජයේ නිලධාරීන්, රාජ්‍ය තාන්ත්‍රික කණ්ඩායම්, සංවර්ධන හවුල්කරුවන් සහ ODI Global සහ CEPA සගයන් ඇතුළු සියලුම දෙනාට ආර්ථික වර්ධන අධ්‍යයන කණ්ඩායමේ සාමාජිකයින්ගේ කෘතඥතාව හිමිවේ.

# පටුන

**පූර්විකාව** / i
**වගු සහ රූප සටහන්** / iv
**විධායක සාරාංශය** / v
1. **හැඳින්වීම: සමාලෝචනය සහ යෝජිත ප්‍රතිපත්ති** / 01
2. **ආර්ථික අර්බුදයට හේතු** / 04
3. **කැපී පෙනෙන ආර්ථික ස්ථාවරත්වයක්, නමුත් අවදානම් පවතී** / 07
4. **ආර්ථික වර්ධන සැලැස්මක ප්‍රධාන අංග සහ ප්‍රතිපත්ති** / 12
   4.1 යහපත් සාර්ව ආර්ථික ප්‍රතිපත්ති / 12
   4.2 ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ / 15
   4.3 විභවතාවයක් ඇති ඉහළ වර්ධන අංශ / 18
   4.4 දරිද්‍රතාව අඩු කිරීම සඳහා ඇති ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීම / 23
5. **ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා වැදගත් වන පාඩම්** / 26
   5.1 දේශපාලනිකව එකඟතාවයක් නොමැතිකම / 26
   5.2 දුර්වල රාජ්‍ය ධාරිතාව / 29
   5.3 සීමිත ව්‍යාපෘති අධීක්ෂණය / 30
   5.4 ඵලදායි ලෙස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රධාන ක්‍රියාමාර්ග / 31
6. **පසු යෙදුම** / 34
**යොමුව** / 36
**උපග්‍රන්ථය 1 භාණ්ඩ හා සේවා අපනයන, විදේශ සෘජු ආයෝජන ගලා ඒම් සහ සංචාරක ඉපැයීම්, රටවල් සංසන්දනය** / 42
**උපග්‍රන්ථය 2 ව්‍යාපෘති අධීක්ෂණය සම්බන්ධ යහපත් පිළිවෙත්** / 43

# වගු සහ රූප සටහන්

## වගු

**වගුව ES1** ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය වේගවත් කිරීම සහ දරිද්‍රතාව අඩු කිරීම සඳහා වන යෝජනා, 2025-2030 **/ viii**

## රූපසටහන්

**රූපසටහන ES1**: ආර්ථික ක්‍රියාකාරිත්වය: අර්බුදයේ සිට ප්‍රකෘතිමත් වීම දක්වා **/ vi**
**රූප සටහන 1**: ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය **/ 01**
**රූප සටහන 2**: රාජ්‍ය ණය, දළ දේශීය නිෂ්පාදිතයේ % ලෙස (පවත්නා වෙළෙඳපොළ මිල අනුව, ඇ.ඩො.) **/ 04**
**රූප සටහන 3**: දිනකට ඩොලර් 3.65 ආදායම මත දරිද්‍රතා ජනගහණ අනුපාතය, 2017 **/ 05**
**රූප සටහන 4**: දළ නිළ සංචිත (චීන මහජන බැංකුව සමඟ වූ හුවමාරු පහසුකම හැර) **/ 08**
**රූප සටහන 5**: ශ්‍රී ලංකාවේ වාර්ෂික සහ කාර්තුමය දළ දේශීය නිෂ්පාදිත වර්ධන අනුපාත (%) **/ 09**
**රූප සටහන 6**: ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සඳහා ප්‍රයෝජනයට නොගත් විභවය - වෙළඳාම සහ ආයෝජනය **/ 16**

# විධායක සාරාංශය

ශ්‍රී ලංකාව වර්තමානය වන විට තීරණාත්මක සන්ධිස්ථානයක සිටී. පසුගිය කාලයේ මුහුණදුන් දරුණුතම ආර්ථික අර්බුදවලින් මිදී ආර්ථිකය ස්ථාවර වෙමින් පවතින අතර, එවන් තත්ත්වයක් නැවත ඇතිවීමේ සැලකිය යුතු අවදානමක් පවතී. දැන් අත්කරගනිමින් පවතින සාර්ව ආර්ථික ස්ථායිකරණය දිගටම පවත්වාගෙන යා යුතු අතර රාජ්‍ය ධාරිතාවය පිළිබඳ විශේෂ අවදානයක් සහිතව ආර්ථික වර්ධන ප්‍රතිපත්ති මාලාවක් ක්‍රියාත්මක කළ යුතුවේ.


2023 වසරේ ආරම්භ වූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යාම සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ සාකච්ඡා ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් වත්මන් රජයට ගෞරවය හිමිවිය යුතුය. මෙය අත්‍යවශ්‍ය ප්‍රතිපත්ති අනුකූලතාව සඳහා පදනම සපයයි.

- වසර 3ක උත්සාහය සහ කැපකිරීම් හේතුවෙන්, ශ්‍රී ලංකාවේ ආර්ථිකය අද වන විට, 2022 දී ණය පැහැර හැරීමේ සහ ආර්ථික අර්බුදයේ අඳුරුතම දිනවලින් මිදී ස්ථාවර වෙමින් පවතී.

- 2024 දී ආර්ථිකය 5% කින් වර්ධනය වූ අතර (2023 දෙවන කාර්තුවෙන් අවසන් වනතුරු අඛණ්ඩව කාර්තු හයක සෘණ වර්ධනයෙන් පසුව) ආර්ථිකය කෙරෙහි විශ්වාසය යම්දුරකට නැවත ඇතිවිය. උද්ධමනය 2022 සැප්තැම්බර් මාසයේ එහි උපරිම අගය වූ 70% සිට සැලකිය යුතු ලෙස අඩු වී ඇත.

- නමුත්, ඇස්තමේන්තුගත ආදායම් දරිද්‍රතාව (දිනකට ඇමරිකානු ඩොලර් 3.65 හෝ ඊට අඩුවෙන්) 2024 දී ජනගහනයෙන් හතරෙන් එකක් තරම් වන අතර, එම අගය 2021 ට සාපේක්ෂව දෙගුණයක් තරම් ඉහළ අගයක් ගනී. දරිද්‍රතාව අඩු කරගැනීමේ ජයග්‍රහණයන් ආර්ථික අර්බුදය අතරතුර ආපසු හැරවුණු අතර ශ්‍රී ලංකාව 2000 දශකයේ මුල් භාගයේ පැවති ඉහළ දරිද්‍රතා මට්ටම් කරා ආපසු ගෙන ගොස් ඇත.

**රූපය 1:** ES1 ආර්ථික ක්‍රියාකාරිත්වය: අර්බුදයේ සිට ප්‍රකෘතිමත් වීම දක්වා




සටහන: e=ඇස්තමේන්තු මූලාශ්‍රය: ප්‍රධාන වාර්තාවේ මූලාශ්‍ර

තවත් වේදනාකාරී ණය ප්‍රතිව්‍යුහගතකරණයක් සහ ඉහළ යන දරිද්‍රතාව වළක්වා ගැනීම සඳහා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ කඩිනමින් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. වෙළඳ යුද්ධයක සහ අඳුරු ගෝලීය ආර්ථික තත්ත්වයක් පිළිබඳ අවදානම වැඩිවන වාතාවරණයකදී ණය පීඩනයෙන් පෙළෙන ශ්‍රී ලංකා ආර්ථිකයට එමඟින් සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකිය. හොඳම තත්ත්වයන් යටතේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අනුව ආර්ථික වර්ධනය 3% ක් විය හැකි අතර ප්‍රතිසංස්කරණ සිදුනොකරන්නේ නම් එයට වඩා පහළ අගයකට ඇද වැටිය හැක. එමෙන්ම දැනටමත් ඉහළ ගොස් ඇති දරිද්‍රතා මට්ටම් තවදුරටත් ඉහළ යාමට ඉඩ ඇත. උපායමාර්ගිකව වැදගත් තැනක පිහිටා ඇති ශ්‍රී ලංකාවට එහි සංකීර්ණ භූ දේශපාලනික තත්වයක් පවතින මෙවන් අවස්ථාවකදී, ආර්ථිකය පරිවර්තනය කිරීමට, පවතින නිෂ්පාදන හැකියාවන් මත ගොඩනැගීමට සහ නව හැකියාවන් නිර්මාණය කිරීමට විශාල අවස්ථාවන් තිබේ. නිදසුනක් වශයෙන්, සංචාරක ව්‍යාපාරය දියුණුවෙමින් පවතින අතර එය තවදුරටත් පුළුල් කල හැකිය.

ඩිජිටල් ආර්ථිකය බොහෝ දුරක් වර්ධනය කිරීමේ විභවය ඇත. කලාපීය බලවතුන් සමඟ සැපයුම් දාමයන් හරහා එක්වී එම වෙළඳපොළවල් හි නිකේතන වෙළඳපොළ අවස්ථාවන් අත්පත්කරගැනීම සහ අගය එකතු කිරීම තවත් එකකි. අවසාන වශයෙන්, කෘෂිකර්මාන්තයේ ඉහළ ආහාර සුරක්ෂිතතාවයකට සහාය විය හැකි අවස්ථා ද පවතී.

2025 දී ප්‍රමුඛතාවය වන්නේ සාර්ව ආර්ථික ස්ථාවරත්වය, ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සහ සහායක ප්‍රමුඛතා අංශ මත පදනම් වූ ආර්ථික වර්ධන සැලැස්මක් ඇතිකරගැනීමයි. එවැනි සැලැස්මක් 2030 දක්වා අවම වශයෙන් වසර පහක්වත් අඛණ්ඩව පවත්වා ගෙන යායුතු අතර ඵලදායී ලෙස ක්‍රියාත්මක කළ යුතුය.

ODI Global (UK) සහ CEPA (Sri Lanka) මූලිකත්වයෙන් සකසන ලද මෙම ස්වාධීන ආර්ථික වර්ධන අධ්‍යයනය, නව ක්‍රියාමාර්ග ගැනීම සඳහා සියලුම පාර්ශවකරුවන් - පුරවැසියන්, රජය, ව්‍යාපාර සහ සිවිල් සමාජය - තුළ උනන්දුවක් ඇතිකිරීම අරමුණු කරයි. ඔවුන් ඉදිරියෙහි ඇති දුෂ්කර ප්‍රතිපත්තිමය තේරීම් සමග පොරබදමින් මෙම වැදගත් අවස්ථාව ග්‍රහණය කරගැනීමේ ඇති අවශ්‍යතාවයද අවධාරණය කරයි.

මෙහි ප්‍රධාන ප්‍රතිපත්ති ක්ෂේත්‍ර හයක් ඇත (ES1 වගුව බලන්න)։

1. සාර්ව ආර්ථික ස්ථාවරත්වය දිගටම පවත්වාගෙන යාම සහ විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම
2. ගෝලීය සැපයුම් දාම, අපනයන සහ විදේශ ඍජු ආයෝජන (FDI) ප්‍රවර්ධනය කිරීම
3. නිෂ්පාදන සාධක වෙළඳපල වැඩිදියුණු කිරීම
4. ආංශික සහ වෙළඳපොළ-විශේෂිත ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
5. දරිද්‍රතාව අඩු කිරීම සඳහා පවතින ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීම
6. ආර්ථික වර්ධන ප්‍රතිපත්ති වටා දේශපාලන සම්මුතිය සහ රාජ්‍ය ධාරිතාව ගොඩනැගීම

**වගුව ES1:** ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය වේගවත් කිරීම සහ දරිද්‍රතාව අඩු කිරීම සඳහා වන යෝජනා, 2025-2030

| **යෝජනාව** | **අදහස්** |
|---|---|
| **සාර්ව ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගෙනයාම සහ විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම** | |
| 1. මහ බැංකු පනත (සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්වාධීනත්වය පවත්වා ගැනීම), රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත සහ රාජ්‍ය ණය කළමනාකරණ පනත අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම ඇතුළුව IMF ආයතනයේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන සම්පූර්ණ කිරීම. | විදේශ සංචිත කළමනාකරණය සහ ජාතික ආර්ථික ආරක්ෂාව සඳහා මහ බැංකුවේ ස්වාධීනත්වය සහ සාර්ව ආර්ථික ස්ථාවරත්වය අත්‍යවශ්‍ය වන අතර, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත ක්‍රියාත්මක කිරීම රාජ්‍ය මූල්‍ය විචක්ෂණභාවය සහතික කරනු ඇත. |
| 2. බදු එකතු කිරීම ඩිජිටල්කරණය (RAMIS) හරහා වැඩි දියුණු කිරීම සහ රේගුවේ සහ සුරාබදු දෙපාර්තමේන්තුවේ තනි කවුළුවක් ස්ථාපිත කිරීම. | මහජන සන්නිවේදනය වැඩිදියුණු කිරීම සහ ගෙවීම් සහ ආපසු ගෙවීමේ ක්‍රියා පටිපාටි සරල කිරීම. බදු එකතු කිරීම පුළුල් කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග දිගටම පවත්වා ගෙනයාම සහ විශාල බදු ගෙවන්නන්ගෙන් හා මගහරින්නන්ගෙන් බදු අයකර ගැනීමට දැඩි ක්‍රියාමාර්ග අඛණ්ඩව ගැනීම. |

| යෝජනාව | අදහස් |
| --- | --- |
| 3. වර්ධනය සඳහා රාජ්‍ය මූල්‍ය වියදම්වල ගුණක බලපෑම් උපරිම කිරීම සඳහා, ඉහළ බලපෑමක් ඇති අංශවලට අයවැයෙන් මුදල් නැවත වෙන් කිරීම සඳහා රාජ්‍ය ආයෝජන නැවත සමාලෝචනය කිරීම. | රාජ්‍ය ආයෝජන ආර්ථික වර්ධනයට ඇති කරන බලපෑම පිළිබඳව දැඩි අවධානයක් යොමුකිරීම (ගුණකයන්). සම්පත් මුදා හැරීමේ කොටසක් ලෙස, අයවැයට සහ රාජ්‍ය බැංකුවලට (උදා: ශ්‍රී ලංකන් ගුවන් සේවය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC), සහ ලංකා විදුලිබල මණ්ඩලය (CEB)) ඍණාත්මක ලෙස බලපාන රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා වන විකල්ප සමාලෝචනය කිරීම. විකල්ප සඳහා වඩා හොඳ කළමනාකරණය, රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්වය (PPP) සහ අලෙවි කිරීම ඇතුළත් විය යුතුය. |
| 4. මුදල් අමාත්‍යාංශය විසින් සකස් කරන ලද ආයෝජන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී 'සුදු අලි ව්‍යාපෘති' වැළැක්වීම සඳහා දැඩි හා විනිවිද පෙනෙන ලෙස සියලුම යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා තෝරා ගැනීමේ ක්‍රියාවලියක් දියත් කිරීම. | මෙයට පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය සහ ව්‍යාපෘති තක්සේරුව පිළිබඳව ප්‍රධාන නිලධාරීන් පුහුණු කිරීම ඇතුළත් විය හැකිය. |

| යෝජනාව | අදහස් |
|---|---|
| **ගෝලීය සැපයුම් දාම, අපනයනය සහ විදේශ සෘජු යෝජන ප්‍රවර්ධනය කිරීම.** | |
| 5. ශ්‍රී ලංකාවට උපරිම ප්‍රතිලාභ ලැබෙන පරිදි නිදහස් වෙළෙඳ ගිවිසුම් යොදාගැනීම සඳහා උපායමාර්ග සකස් කිරීම සහ එම සාකච්ඡා ඵලදායී කරගැනීම සඳහා අවශ්‍ය රාජ්‍ය ධාරිතාව ගොඩනැගීම. | බංග්ලාදේශය, ඉන්දියාව සහ චීනය සමඟ ඇති නිදහස් වෙළඳ ගිවිසුම්වලින් ලැබෙන ප්‍රතිලාභ වල  බලපෑම් පිළිබඳ දැඩි තක්සේරුවක් කිරීම.<br><br>පවත්නා නිදහස් වෙළඳ ගිවිසුම්වල (උදා: තායිලන්තය) මනාපයන් භාවිතා කිරීම සඳහා ව්‍යාපාරවලට සහාය වීම. නිසි ලෙස සම්පත් සහිත ශ්‍රී ලංකා වෙළඳ නියෝජිත කාර්යාලයක් හරහා නිදහස් වෙළඳ ගිවිසුම් සාකච්ඡා නැවත ආරම්භ කිරීම.<br><br>ශ්‍රී ලංකා වෙළඳ නියෝජිත කාර්යාලයක් පිහිටුවීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම සහ නිදහස් වෙළඳ ගිවිසුම් සාකච්ඡා පිළිබඳ හැකියාවන් ගොඩනැගීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. |
| 6. ශ්‍රී ලංකාවේ සාපේක්ෂ වාසිය සහ ජාතික අවශ්‍යතාවයන්ට අනුකූලව තීරුබදු සකස් කිරීම සඳහා විශේෂඥතාව මෙන්ම ඉහළ කාර්යසාධනයක් ඇති සාමාජිකයින්ගෙන් සමන්විත ජනාධිපති කොමිසමක් පත් කිරීම. | සැපයුම් දාමයන්ට ඇතුළුවීමට සහාය වීම සඳහා අතරමැදි භාණ්ඩ ආනයනය සඳහා වන ආනයන තීරුබදු ක්‍රමයෙන් අඩු කිරීම සහ ප්‍රතිබදු ක්‍රමයෙන් ඉවත් කිරීම, අඛණ්ඩවම සිදුකිරීම. |

| යෝජනාව | අදහස් |
|---|---|
| 7. ශ්‍රී ලංකාවේ අපනයන සඳහා වන ඕනෑම තීරුබදු වැඩිවීමක් අවම කිරීම සඳහා ඇමරිකා එක්සත් ජනපදය සමග රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවයකට යොමුවීම. | |
| 8. ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතුවල ප්‍රතිලාභ උපරිම කිරීම සඳහා, ප්‍රධාන වෙළඳ ගිවිසුම් සහ නිදහස් වෙළඳ ගිවිසුම් ඇති රටවල්වල කේන්ද්‍රීය කාර්යාල කිහිපයක් නිර්මාණය කිරීම. ඒ වෙනුවෙන් ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල ප්‍රතිසංවිධානය කිරීම. | අලෙවිකරණ/වාණිජ කටයුතු පිළිබද විශේෂිත දැනුමක් ඇති කාර්ය මණ්ඩලයක් (උදා: පුද්ගලික අංශයෙන්) සහිත මධ්‍යස්ථාන (උදා: ඇමරිකා එක්සත් ජනපදය, යුරෝපා සංගමය, එක්සත් රාජධානිය, ඉන්දියාව, චීනය, ජපානය, සිංගප්පූරුව, තායිලන්තය, පකිස්ථානය) ඇතිකිරීමත්, ඒවායේ කාර්ය මණ්ඩල වලට කාර්ය සාධන දිරිගැන්වීම් සහ ඉලක්ක සැපයීම. |
| 9. මෙරට වෙළෙඳපලට ඇතුළුවීම, පිටවීම සහ ව්‍යාපාර මෙහෙයුම් සම්බන්ධ කටයුතු වලදී විදේශීය සහ දේශීය ආයෝජකයින් සඳහා ඇති දුෂ්කර රෙගුලාසි දැඩි ලෙස කපා හැරීම. ඒ සඳහා ඉතා කඩිනම් ප්‍රතිසංස්කරණ සිදු කිරීම. | ලෝක බැංකුවේ "Be Ready Index" දර්ශකය සඳහා අවශ්‍ය දත්ත රැස් කර ව්‍යාපාරික වාතාවරණය වැඩිදියුණු කිරීම සඳහා සූදානම්වීම.<br>කුඩා පරිමාණ විදේශීය ආයෝජකයින්ට මෙරට වෙළෙඳපොලට ඇතුළුවීම සහ ක්‍රියාකාරිත්වය සඳහා ඇති දුෂ්කරතා ඉවත්කිරීම.<br><br>ජාතික ආර්ථිකයට ප්‍රතිලාභ සැලසීම සඳහා කොළඹ වරාය නගරයේ බොහෝ ප්‍රමාද වූ පූර්ණ විභවය අත්පත් කරගැනීම. නීතිමය රාමුව සහ ඒ වෙනුවෙන්ම යෝජිත ඒකාබද්ධ නියාමන අධිකාරිය පිහිටුවීම වේගවත් කිරීම. |

| යෝජනාව | අදහස් |
|---|---|
| 10. ආයෝජන මණ්ඩලය සහ විදේශ දූත මණ්ඩල උපායමාර්ගික වෙළෙඳපොළවල සිටින (උදා: ඕස්ට්‍රේලියාව, කැනඩාව, එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය සහ මැදපෙරදිග) විදේශීය ශ්‍රී ලාංකිකයන්ගෙන් ආයෝජන ප්‍රවර්ධනය කිරීම. | විදේශගත ශ්‍රී ලාංකිකයින්ට, ඉන්දියාවේ විදේශ පුරවැසි යෝජනා ක්‍රමය වැනි විකල්පයක් පිරිනැමීම. |
| 11. කලාපීය සැපයුම් දාම ඒකාබද්ධතාවය සහ අපනයන ප්‍රවර්ධනය කිරීම සඳහා, දකුණු ඉන්දියානු ප්‍රාන්ත පහ සහ ශ්‍රී ලංකාව අතර ව්‍යාපාර-ව්‍යාපාර සබඳතා (B-B) දිරිමත් කිරීම වෙනුවෙන් අදාල රාජ්‍ය වාණිජ මණ්ඩලවල සංචාර සංවිධානය කිරීම. | දකුණු ඉන්දියානු ප්‍රාන්ත පහ වන්නේ ආන්ද්‍ර ප්‍රදේශ, කර්ණාටක, කේරළ, තෙලන්ගානා සහ තමිල්නාඩු ය.<br><br>ඉන්දියාවේ Make in India වැඩසටහනක් වැනි වැඩසටහනක් ශ්‍රී ලංකාවේ ද ක්‍රියාත්මක කිරීම, ප්‍රයෝජනවත් දිරිගැන්වීමක් විය හැකිය. |
| 12. වෙළඳාමට අදාළ තීරණාත්මක යටිතල පහසුකම් සහ වෙළඳ පහසුකම් සැපයීම සඳහා ආයෝජනය කිරීම. | ගුවන් හා නැව් ප්‍රවාහයන්ට සම්බන්ධ වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධනය පිළිබඳ ව්‍යාපෘති සමාලෝචනය කිරීම (උදා: උතුරු කොළඹ පර්යන්තය, කොළඹ වරාය, කන්කසන්තුරය වරාය පුළුල් කිරීම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සහ පලාලි ගුවන්තොටුපළ පුළුල් කිරීම) රේගු ක්‍රියා පටිපාටි නවීකරණය කිරීම (නව රේගු පනත ක්‍රියාත්මක කිරීම) සහ ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳ පහසුකම් ගිවිසුම ක්‍රියාත්මක කිරීම. |

| යෝජනාව | අදහස් |
|---|---|
| **නිෂ්පාදන සාධක වෙළඳපල වැඩිදියුණු කිරීම** | |
| 13. තාක්ෂණික ශ්‍රම බලකායේ කුසලතා (නවීන ඩිජිටල් ආර්ථිකයට අදාළ ඒවා ඇතුළුව) වැඩිදියුණු කිරීමට පුහුණුව ලබාදීමට ආයතනික මට්ටමේ වියදම් දිරිමත් කිරීම සඳහා බදු දිරිගැන්වීම් ලබා දීම. | මෙම දිරිගැන්වීම් මඟින් පුහුණු වියදම් සඳහා අවම වශයෙන් විකුණුම් වලින් 0.5% ක් දක්වා බදු සහන ලබා දිය හැකිය.<br><br>පාසැල් විෂය නිර්දේශවල දුර්වලතා සහ යාවත්කාලීන නොවූ ඉගැන්වීම් ක්‍රම පිළිබඳ ගැටළු නිරාකරණය සඳහා ගුරු පුහුණු වැඩසටහන් විවරණය කිරීම. |
| 14. උසස් තත්ත්වයේ රැකියා පුළුල් කිරීම සඳහා, විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය (STEM) අධ්‍යාපනය සඳහා ජාතික විශිෂ්ටතා මධ්‍යස්ථානයක් පිහිටුවීම. | ඉතා කීර්තිමත් ජාත්‍යන්තර විශ්ව විද්‍යාලයක් සමඟ හවුල්කාරිත්වයෙන්, මොරටුව විශ්වවිද්‍යාලය වැනි ජාතික මධ්‍යස්ථානයක් බවට පත් කිරීමට සලකා බැලීම. |
| 15. ශ්‍රම ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා, වැටුප් සහිත රාජ්‍ය අංශයේ නිවාඩු හිමිකම් විධිමත් කිරීම. | දැනට පවතින රජයේ නිවාඩු දින ක්‍රමයෙන් නැගෙනහිර ආසියාවේ ඉහළ ක්‍රියාකාරී ආර්ථිකයන්ගේ මට්ටම් දක්වා අඩු කළ හැකිය. උදාහරණයක් ලෙස, සිංගප්පූරුව සහ දකුණු කොරියාවට රජයේ නිවාඩු දින 11 බැගින් ඇති අතර වියට්නාමයට රජයේ නිවාඩු දින 13 ක් ඇත. |

| යෝජනාව | අදහස් |
|---|---|
| 16. අවුරුදු 5 ට අඩු ළමුන් සඳහා ළදරු නිවාස, දිවා ආහාර වේලක් සහ ආරක්ෂිත ප්‍රවාහන පහසුකම් සැපයීමට ආයතන දිරිමත් කිරීම මගින් කාන්තා ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය වැඩි කිරීම. | |
| 17. විදේශගත වීම නිසා ආර්ථිකය පුරා ඇතිවන උග්‍ර කුසලතා හිඩැස් පිරවීම සඳහා, ඩුබායි/සිංගප්පූරු ආකෘති අනුගමනය කරමින් තාවකාලික සංක්‍රමණ ක්‍රියාවලීන් විධිමත් කිරීම. ඒ සඳහා ශ්‍රම වෙළඳපොළ ක්‍රමයෙන් විවෘත කිරීම. | රාජ්‍ය අංශයේ සේවකයින් සඳහා විදේශයන්හි තාවකාලික රැකියා සඳහා මෑතකදී හඳුන්වා දුන් යෝජනා ක්‍රමයේ බලපෑම සහ ඵලදායීතාවය තක්සේරු කිරීම. |
| 18. ව්‍යාපාරික කටයුතු සඳහා ඉඩම් හිගය සමනය කිරීම වෙනුවෙන්, රජයේ ඉඩම් අවුරුදු 25 ක බදු පදනම මත ලබා දීම සඳහා ඉඩම් බැංකුවක් සක්‍රීය කිරීම. | නිසි ලෙස තක්සේරු කරන ලද වාණිජමය කොන්දේසි මත කල්බදු ලබා දිය හැක. |

| යෝජනාව | අදහස් |
|---|---|
| **ආංශික සහ වෙළඳපොළ-විශේෂිත ප්‍රතිපත්ති** | |
| 19. ශ්‍රී ලංකාවේ ආංශික හා ව්‍යාපාරික අවස්ථා සහ සාපේක්ෂ වාසිය පිළිබඳ දැඩි සමාලෝචනයක් සිදු කිරීම. | නිෂ්පාදන සහ වෙළඳ සංඛ්‍යාලේඛන සහ ව්‍යවසාය දත්ත රැස් කිරීමට සහ විශ්ලේෂණය කිරීමට රාජ්‍ය ධාරිතාවය ගොඩනැගීම. සංසන්දනාත්මක රටවල් සමූහයක් සමඟ නිෂ්පාදනය සහ වෙළඳාම පිළිබඳ සැසඳීම් මිණුම් සලකුණු කිරීමට සහාය වීම. |
| 20. සංචාරකයින්ගේ පැමිණීම සහ රට පුරාම ප්‍රවර්ධනය කිරීම සඳහා, ශ්‍රී ලංකාව විවිධත්වයෙන් යුතු අව්‍යාජ සංචාරක ගමනාන්තයක් ලෙස සන්නාමකරණය සහ අලෙවිකරණය කිරීම. එමෙන්ම අඩුවෙන් සංචාරකයන් පැමිණෙන කලාපවල ඉලක්කගත සංවර්ධනය සඳහා වියදම් වැඩි කිරීම. | උතුරු-මැද, ඌව, උතුරු සහ නැගෙනහිර පළාත් අඩුවෙන් සංචාරකයන් පැමිණෙන කලාප වේ.<br><br>“පිලිපීනයේ it is more fun in the Phillipines, ඉන්දියාවේ Incredible India හෝ Malaysia, Trully Asia” ආදී උදාහරණ අනුකරණය කරමින් ‘Fabulous Sri Lanka’ වැනි තේමා පාඨයක් සැකසීම.<br><br>භෞතික ආරක්ෂාව (විශේෂයෙන් කාන්තාවන්), හෝටල්/ආගන්තුක නිකේතනවල සේවා ප්‍රමිතීන්, අවන්හල්වල/නිකේතනවල මැනවින් සැකසූ ආහාර, ගෙවන මුදලට වටිනාකම සහ තිරසාරභාවය සහතික කිරීම වෙනුවෙන් සුදුසු තත්ත්ව සහතික කිරීමට දිවයින පුරා සංචාරක ව්‍යාපාරයට ජාත්‍යන්තර ප්‍රමිතීන් හඳුන්වාදීම. එක් පදිංචිකරුවෙකුට සංචාරකයින් 0.51 ක් පැමිණෙන තායිලන්තය ආදර්ශයක් විය හැකිය.<br><br>ප්‍රධාන ගමනාන්තවල ගමනාගමනය මත යැපෙන මිලකරණය ඇතුළුව සංචාරක සේවා ඩිජිටල්කරණය කිරීම මඟින් තිරසාර සංචාරක කර්මාන්තය වර්ධනයට සහාය වීම. |

| යෝජනාව | අදහස් |
|---|---|
| 21. ඵලදායිතාව වැඩි කිරීම, දේශගුණයට ඔරොත්තු දෙන කෘෂිකර්මාන්තය සඳහා නවීන පිළිවෙත් හඳුන්වා දීම සහ නීති ප්‍රතිසංස්කරණ මගින් කෘෂිකර්මාන්තයේ සහ ධීවර කර්මාන්තයේ අගය එකතු කිරීම් වැඩි කිරීම. | කුඹුරු ඉඩම් පනත සමාලෝචනය කිරීම..<br><br>අපනයන වෙළඳපොළවල ජාත්‍යන්තර සහ අනෙකුත් ප්‍රමිතීන් දැඩි ලෙස අනුගමනය කිරීම.<br><br>යෙදවුම් මිලදී ගැනීම සහ අලෙවිකරණය සම්බන්ධයෙන් කුඩා වතු හිමියන් විසින් සාමූහික ක්‍රියාමාර්ග ගැනීමට දිරිගැන්වීම.<br><br>පුහුණුව සහ කාර්යසාධන ඉලක්ක (KPI) හරහා කෘෂිකාර්මික සේවා මධ්‍යස්ථානවල මෙහෙයුම් නැවත පණ ගැන්වීම. විශ්වවිද්‍යාල වල කෘෂිකර්මය/කෘෂි ව්‍යාපාර පීඨවල දැනුම/පුහුණු ධාරිතාව වාණිජකරණය කිරීම |
| 22. බලශක්ති ආරක්ෂාව සහ බලශක්ති වෙළඳාම වැඩිදියුණු කිරීම සඳහා, ද්විපාර්ශ්වික විදුලිබල ජාල සහ ඉන්ධන නල මාර්ග සම්බන්ධතාවය වෙනුවෙන් ඉන්දියානු ආධාර සහ විදේශ සෘජු ආයෝජන උපයෝගී කරගැනීම. | |

| යෝජනාව | අදහස් |
| --- | --- |
| 23. බාධක ඉවත් කිරීම සහ තරඟකාරිත්වය වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් නිෂ්පාදනයට ඵලදායී ලෙස සහාය වීම සඳහා ප්‍රතිපත්ති සහ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම. | ව්‍යාපාර මෙහෙයුම් සඳහා වඩාත් හිතකර පරිසරයක් නිර්මාණය කිරීම වෙනුවෙන් රෙගුලාසි, ආයතන සහ ක්‍රියා පටිපාටි සරල කිරීම සහ තාර්කික කිරීම.<br><br>අඛණ්ඩව කාර්මිකකරණ ක්‍රියාවලිය සහ කර්මාන්තවල ජාත්‍යන්තර තරඟකාරිත්වය පවත්වා ගැනීම සඳහා ප්‍රාථමික සහ ද්විතීයික යන දෙඅංශයේම යෙදවුම් ලබා ගැනීමේ හැකියාව, දැරිය හැකි මිල සහ ගුණාත්මකභාවය සහතික කිරීම.<br><br>ඩිජිටල්කරණය කරන ලද ක්‍රියාවලීන් අනුගමනය කරමින් රටවල් අතර ගනුදෙනු සම්බන්ධ ප්‍රතිපත්ති සහ රෙගුලාසි ප්‍රතිසංස්කරණය කිරීම. වෙළඳ හා ආයෝජන ප්‍රවාහයන් විධිමත් කිරීම සඳහා "තනි කවුළුවක්" සහිත පද්ධතියක් ඇති කිරීම. තිරසාර ප්‍රමිතීන් සහ උසස් ඩිජිටල් ක්‍රියාවලීන්ට අනුගත වෙමින් 21 වන සියවසේ අවශ්‍යතා සමඟ කාර්මිකකරණය පෙළගැස්වීම.<br><br>වඩාත් සාධාරණව පැතිරුණු වර්ධනයක් ඇති කිරීම සහ උපායමාර්ගික කර්මාන්ත සඳහා සහාය වීම වෙනුවෙන් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශ, ප්‍රාදේශීය කාර්මිකකරණය සහ ඉලක්කගත කර්මාන්ත වැනි වැදගත් ක්ෂේත්‍රවල රජයේ කාර්යභාරය පුළුල් කිරීම. |

| යෝජනාව | අදහස් |
|---|---|
| 24. ඩිජිටල් පොදු යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීම, විද්‍යුත් රාජ්‍ය මහජන සේවාවන් වැඩිදියුණු කිරීම සහ ඩිජිටල් ගෙවීම්වල ආකර්ශනීය බව වැඩි කිරීම. | ශක්තිමත් දත්ත ආරක්ෂාවක් සහ සයිබර් ආරක්ෂණ ප්‍රමිතීන් හා නියාමන ප්‍රතිසංස්කරණ සහිත ඩිජිටල් හැඳුනුම්පතක් හඳුන්වාදීම කඩිනම් කිරීම.<br><br>ඩිජිටල් ආර්ථිකය සහ සේවාවන් පිළිබඳ දත්ත සමුදායක් සකස් කිරීම (උදා: විද්‍යුත් වාණිජ්‍යය සහ විද්‍යුත් ගෙවීම් පිළිබඳ සමීක්ෂණයක්). |
| **දරිද්‍රතාව අඩු කිරීම** | |
| 25. ආහාර සුරක්ෂිතතාව වැඩි දියුණු කිරීම සහ ඉහළ ආහාර මිල අඩු කිරීම සඳහා, පසුඅස්වනු නාස්තිය අවම කිරීම සහ ආහාර හිගයන් මඟහරවා ගැනීම. | ආහාර මිල අඩු කිරීමට භාණ්ඩ හිගය සමනය කිරීම සඳහා හදිසි පියවරක් ලෙස (අවශ්‍ය පරිදි) ආහාර ආනයනය ලිහිල් කිරීම.<br><br>වඩා හොඳ ශීතාගාර පද්ධති සඳහා සුපිරි වෙළඳසැල්/වෙළෙන්දන් සමග හවුල් වීම, ඉක්මණින් නරක් වන ආහාර ප්‍රවාහනය සඳහා නවීන ශීතාගාර බහාලුම් හඳුන්වා දීම, ආහාර ප්‍රවාහනය සඳහා ලංගම බස් රථ භාවිතා කිරීම සඳහා නියමු ව්‍යාපෘතියක් ගවේෂණය කිරීම සහ පසු අස්වනු නාස්තිය අවම කිරීම සඳහා දුම්රිය ප්‍රවාහනය සඳහා ආයෝජනය කිරීම.<br><br>අඩු ආදායම්ලාභීන්ට පාලන මිල ගණන් යටතේ මූලික ආහාර මල්ලක් විකිණීම සඳහා සතොස අලෙවිසැල් ජාල වැඩි දියුණු කිරීම. |

| යෝජනාව | අදහස් |
| --- | --- |
| 26. අස්වැසුම වැඩසටහන යටතේ, සීමිත කාලයක් සඳහා අත්‍යවශ්‍ය පරිභෝජනය වෙනුවෙන් වඩාත් දිළිඳුම ජනතාව වෙත  මූල්‍ය සහනාධාරයක් ලබාදීම. එම සහනාධාර වැඩසටහන වඩා හොඳින් ඉලක්ක කර ගනිමින්, ගුණාත්මක කාර්යයක් බවට පත් කිරීම සඳහා සම්බන්ධීකරණ සහාය ලබා දීම. | වඩාත් නිවැරදි ඉලක්කගත දත්ත නොමැතිවිට ගෘහස්ථ විදුලි පරිභෝජනය හෝ ජංගම දත්ත භාවිතය, ආදායම් තත්ත්ව සෙවීම සඳහා භාවිතා කළ හැකිය.<br><br>විද්‍යුත් මුදල් හුවමාරුව සක්‍රීය කිරීම සඳහා ඩිජිටල් හැඳුනුම්පත් යෝජනා ක්‍රමය ක්‍රියාවට නැගීම කඩිනම් කිරීම සහ සයිබර් ආරක්ෂණ හැකියාවන් වැඩි දියුණු කිරීම.<br><br>විද්‍යුත් මුදල් හුවමාරුව සක්‍රීය කිරීම සඳහා බැංකු ගිණුම් විවෘත කිරීමට අඩු ආදායම්ලාභීන්  දිරිමත් කිරීම. |
| 27. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වැඩි දියුණු කළ සංවර්ධන මූල්‍යකරණයන් වැඩිකිරීම පිළිබඳව අධ්‍යයනය කිරීම. ඒ සඳහා පවතින මූල්‍ය ආයතන සහ/හෝ නව ආයතනයක් යොදාගැනීම සහ ජාතික වශයෙන් විශ්වසනීය ණය ලකුණු කිරීමේ පද්ධතියක් පිහිටුවීම. | ආසියානු සංවර්ධන බැංකුව වැනි මූල්‍යායතනවලින් දිගුකාලීන ණය මාර්ග ලබාගනිමින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සදහා ණය දීමේදි අවදානම වැඩි කරන කල්පිරීමේ නොගැලපීම් තත්ත්වයන් අවම කරගැනීම.<br><br>සංචාරක හා කෘෂිකර්මාන්තය වැනි අංශ සඳහා මූල්‍යකරණය කෙරෙහි අවධානය යොමු කිරීම.<br><br>සියලුම අදාළ දත්ත මූලාශ්‍ර ඇතුළත් කිරීමෙන් ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ (CRIB) ණය ලකුණු කිරීමේ සේවා පුළුල් කිරීම.<br><br>අපනයන විවිධාංගීකරණය ඉලක්ක කරගත් වැඩි අගය එකතු කිරීමක් සහිත කර්මාන්ත දිරිමත් කිරීම. |

| යෝජනාව | අදහස් |
|---|---|
| | මූල්‍යකරණය සහ වෙළඳපොළට ප්‍රවේශ වීමට ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට පහසුකම් සැලසීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB), කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB), වාණිජ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (SLECIC) යන ආයතනයන්හි සේවාවන් ශක්තිමත් කිරීම. ව්‍යාපාර අවදානම් අවම කිරීම සඳහා රක්ෂණ සේවාවලට අඩුවෙන් පෙළඹවීම පිළිබඳ ප්‍රශ්නයට විසඳුම් ලබාදීමට යොමුවීම.<br><br>සියලුම පාර්ශවකරුවන් සමඟ සහයෝගයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාතික මූල්‍ය අන්තර්ගතභාවය පිළිබව උපායමාර්ග, මූල්‍ය සාක්ෂරතාවය පිළිබද මාර්ගෝපදේශය ඇතුළුව, ක්‍රියාත්මක කිරීම. |
| **ප්‍රතිපත්තිමය එකඟතාව සහ රාජ්‍ය ධාරිතාව ගොඩනැගීම** | |
| 28. දකුණු කොරියාව, මැලේසියාව, සිංගප්පූරුව, තායිලන්තය, වියට්නාමය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ ඉන්දියාව වැනි රටවල සාර්ථකත්වයන් පිළිබඳ උදාහරණ යොදා ගනිමින් ජාතික වර්ධන සැලැස්මක් සකස් කිරීම සඳහා රජය ස්වාධීන ආර්ථික වර්ධන කොමිසමක් පත්කිරීම | සැලසුම සහ දිගුකාලීන ක්‍රියාත්මක කිරීම පිළිබඳ එකඟතාවයක් ඇතිකර ගැනීම සඳහා රජය විසින් ප්‍රධාන කොටස්කරුවන් සමඟ ජාතික සමුළුවක් කැඳවීම. මෙයින් ලැබෙන අදහස් ආර්ථික පරිවර්තන පනත සංශෝධනය කිරීම යොදා ගත හැක. |

| යෝජනාව | අදහස් |
|---|---|
| 29. ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ ව්‍යාපෘති අධීක්ෂණය කිරීම සඳහා විශේෂ අවධානයක් ඇති කිරීම: (අ) ප්‍රමුඛතා සැකසීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වන සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම උදෙසා සංවර්ධන කටයුතුවල නිරත අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ කමිටුවක්, (ආ) සියලුම ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති අධීක්ෂණය සඳහා ජාතික මෙහෙයුම් කාර්යාලයක්, (ඇ) ව්‍යාපෘති තෝරාගැනීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් සහ (ඈ) ප්‍රමුඛතාගත මහා පරිමාණ ව්‍යාපෘතිවල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා ව්‍යාපෘති අධීක්ෂණ කමිටුවක් ස්ථාපිත කිරීම. | එවැනි මුලපිරීම් සාර්ව ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගැනීමේ අවශ්‍යතාව කෙරෙහි ද අවධානය දැක්වීම. |
| 30. රාජ්‍ය සේවකයින් සහ මහජන නියෝජිතයන් සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති සහ පරිපාලනය පිළිබඳ පුහුණුව සැලකිය යුතු ලෙස වැඩිදියුණු කිරීම. | රාජ්‍ය සේවකයින් සහ මහජන නියෝජිතයින්ට විධායක මට්ටමේ අධ්‍යාපනය ලබා දීම සඳහා ඉහළම මට්ටමේ රාජ්‍ය ප්‍රතිපත්ති සහ රාජ්‍ය පරිපාලන පාසලක් ස්ථාපිත කිරීම සඳහා ජාත්‍යන්තර මට්ටමේ විශ්ව විද්‍යාලයක් සමඟ හවුල් වීම. උදා: පැරීසියේ Science Po, කැන්බරා හි ANU හි ක්‍රෝෆර්ඩ් රාජ්‍ය ප්‍රතිපත්ති පාසල සහ සිංගප්පූරුවේ LKY පාසල |


| යෝජනාව | අදහස් |
| --- | --- |
| | රාජ්‍ය සේවකයින්ට නවීන රාජ්‍ය සේවා කළමනාකරණය, ගෙවන මුදලට වටිනාකමක් ඇති සේවා සැපයීම සහ අඛණ්ඩතාව පිළිබඳ පුහුණුව ලබාදීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) ජාත්‍යන්තරයේ ඇති එවැනි ආයතන සමඟ (උදා: මැලේසියාව, ඉන්දියාව සහ ඕස්ට්‍රේලියාව) සම්බන්ධ කිරීමට ඇති හැකියාව සොයාබැලීම. |

# 1. හැඳින්වීම: සමාලෝචනය සහ යෝජිත ප්‍රතිපත්ති

1948 නිදහස ලැබීමේ දී, ශ්‍රී ලංකාව බොහෝ සමාජ-ආර්ථික දර්ශක අතින් ජපානයට පසු දෙවන ස්ථානයේ පසුවූ අතර 1960 දී ඒක පුද්ගල ආදායම අතින් දකුණු කොරියාවට වඩා ඉදිරියෙන් සිටියේය; එතැන් සිට එය බොහෝ ආසියානු අසල්වැසි රටවලට වඩා පසුබෑමකට ලක්ව ඇත. (උපග්‍රන්ථයේ වගුව 1 සහ රූපසටහන 1 බලන්න)[1]. 2022 දී, ශ්‍රී ලංකාව විදේශ ණය සේවාකරණය පැහැර හැරීමෙන් පසු ආර්ථිකයටත් ශ්‍රී ලාංකීය ජනතාවටත් දැඩි බලපෑම් ඇතිවිය. ඒත් සමගම ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) 17 වන වැඩසටහනට ඇතුළු විය.

ශ්‍රී ලංකාවේ අත්දැකීම්, පශ්චාත් කොවිඩ් ණය අර්බුදය සමග පොරබදමින් සිටින මධ්‍යම ආදායම් ලබන රටවලට වටිනා පාඩම් සපයයි. 2024 සිට ආර්ථිකය ස්ථාවරත්වයේ සලකුණු පෙන්නුම් කර ඇතත් ධනාත්මක වර්ධනය, අඩු උද්ධමනය, සංචාරක කර්මාන්තයේ උත්පාතය සහ ඉහළ යන කොටස් වෙළඳපොළක් මගින් එය ශක්තිමත් කර ඇත (IMF,2025) - අඛණ්ඩ ආර්ථික වර්ධනය සහ ආර්ථික පරිවර්තනය සඳහා වන අභියෝග අවසන් වී නැත.

**රූපසටහන 1:** ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (පවත්නා වෙළෙඳපොල මිල අනුව ඇ.ඩො.)




මූලාශ්‍රය: ලෝක බැංකු ලෝක සංවර්ධන දර්ශක දත්ත සමුදාය

1 ශ්‍රී ලංකාවේ සංවර්ධන අපගමනය සඳහා පැහැදිලි කිරීම් - කැලේගම (2000); අමරසේකර සහ වෙනුගනන් (2021) ඇතුළත් වේ.

ශ්‍රී ලංකාව අභිමුව අවස්ථා සහ අවදානම් යන කරුණු දෙකම පවතින අතර නව රජය විසින් සියලු ශ්‍රී ලාංකිකයින් ඇතුළත්වන පරිවර්තනීය වර්ධනයක් කරා යන නව මාවතක් සකස් කිරීම තීරණාත්මක වේ. එමඟින් ණය තිරසාරභාවය තහවුරු කළ යුතු අතර, අනාගත අර්බුද වළක්වා ගනිමින් සෑම පුරවැසියෙකුටම ප්‍රතිලාභ ලබාදීම ද වැදගත් වේ. සුපුරුදු අයුරින් ව්‍යාපාර කිරීම තුළ, අඩු තරඟකාරිත්වය හේතුවෙන් එකම චක්‍රයක කැරකෙමින්, වර්ධනයෙන් හා ණය බරින් මිදෙමින් පවතී.

මෙම තීරණාත්මක අවශ්‍යතාවය සපුරාලීම සඳහා, ODI Global විසින් ශ්‍රී ලංකාවට නව වර්ධන සැලැස්මක් සකස් කිරීම වෙනුවෙන් ශ්‍රී ලාංකික ආර්ථික චින්තකයින් සමඟ අධ්‍යයන කණ්ඩායමක් ආරම්භ කර ඇත. මෙම අභ්‍යාසය අපගේ සම-සංස්කරණයෙන් කරන ලද ලිපි මාලාවක් වන **"ශ්‍රී ලංකාවඃ ණය පැහැර හැරීමේ සිට පරිවර්තනීය වර්ධනය දක්වා"** යන්න මත ගොඩනගා ඇති අතර එය ප්‍රමුඛ ශ්‍රී ලාංකික සහ ජාත්‍යන්තර විශේෂඥයින්ගේ දැනුම මත පදනම් වූ ප්‍රායෝගික ප්‍රතිපත්ති යෝජනා 27 ක් ඉදිරිපත් කරයි (විග්නරාජා සහ ටී වෙල්ඩේ, 2025 සංස්කරණ).

ශ්‍රී ලංකාව  එහි ආර්ථිකය යළි නගාසිටුවීමේ වැඩසටහන මධ්‍යයේ, එක්සත් ජනපදය විසින් පනවන ලද  අන්‍යෝන්‍ය තීරුබදු ක්‍රමය මඟින් මතුවෙමින් පවතින ගෝලීය අභියෝග ද ජය ගත යුතුය. යෝජිත පරිදි ක්‍රියාත්මක කළහොත්, මෙම තීරුබදු ශ්‍රී ලංකාවේ අපනයනවලින් හතරෙන් එකකට සෘජුවම බලපානු ඇති අතර, රටේ අපනයන තරඟකාරිත්වය පහළ දමනු ඇත. ගෝලීය වෙළඳ ආතතීන්, ප්‍රතිපත්ති අවිනිශ්චිතතාවයන් සහ ලෝක ආර්ථිකයේ විභව පසුබෑම යන කරුණු ශ්‍රී ලංකා ආර්ථිකය ප්‍රකෘතිමත් වීමේ ගමන තවදුරටත් සංකීර්ණ කරයි. කෙසේ වෙතත්, මෙම අභියෝග ශ්‍රී ලංකාවේ ආරක්ෂිත වෙළඳ ප්‍රතිපත්තිවල  සංකීර්ණතා ඉස්මතු කරන අතරම අවශ්‍ය ප්‍රතිසංස්කරණ සඳහා නව අවස්ථා ද උදාකරයි.


ආර්ථික අර්බුදයේ සහ මෙම බාහිර පීඩනවල කල් පවතින බලපෑම් සැලකිල්ලට ගනිද්දී, පරිවර්තනීය සහ තිරසාර වර්ධනයක් අත්කර ගැනීම ඉතා වැදගත් වේ. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය සහ ණය තිරසාරභාවය ඇතිකරගනිමින් ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමේ වැඩසටහන සඳහා ආර්ථික වර්ධනය අත්‍යවශ්‍ය වේ. ධනාත්මකව සළකද්දී වඩා යහපත් රාජ්‍ය මූල්‍ය වියදම්, වේගවත් වර්ධනයක් ලබා දෙයි. එය බාහිර කම්පනවලට එරෙහිව රටේ අවදානම අඩු කරන අතර, යළි ආර්ථික අර්බුදයක් ඇතිවීම වළක්වා ගනු ඇත. ආර්ථික වර්ධනය නමැති මාවත විසින් නව රැකියා නිර්මාණය කිරීම සහ ආදායම් උත්පාදනය කිරීම හරහා අර්බුදය නිසා ඇතිවන ආදායම් පාඩු සහ දැවැන්ත දරිද්‍රතා මට්ටම් සමනය කරනු ඇත. අවසාන වශයෙන්, ඉදිරි වසර 25 තුළ ශ්‍රී ලංකාවේ ඉහළ ආදායම් ඉලක්කය සපුරා ගැනීම සඳහා පවතින අතිශය වැදගත් කරුණක් වන්නේ තිරසාර ඉහළ වර්ධන ගම්‍යතාවයකි.

මෙම වාර්තාව පහත පරිදි ව්‍යුහගත කර ඇත. 2 වන කොටස ආර්ථික අර්බුදයට හේතු කෙටියෙන් සාකච්ඡා කරයි. 3 වන කොටසෙහි දී වර්ධනය වන අවදානම් සහිතව වුවත් අත්පත් කරමින් පවතින ආර්ථික ස්ථාවරත්වය සමාලෝචනය කරයි, 4 වන කොටසෙහි ආර්ථික වර්ධන සැලැස්මක ප්‍රධාන අංග සහ ප්‍රතිපත්ති දක්වා ඇත. 5 වන කොටසෙහි ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා අත්‍යාවශ්‍ය පාඩම් මොනවාදැයි සාකච්ඡා කරන අතර 6 වන කොටස අවසාන විග්‍රහය වේ. ES1 වගුව - ශ්‍රී ලංකාවේ වර්ධනය වේගවත් කිරීම සහ දරිද්‍රතාව අඩු කිරීම සඳහා යෝජනා සපයයි.

# 2. ආර්ථික අර්බුදයට හේතු

ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාගේ නායකත්වයෙන් යුත් ජාතික ජන බලවේගයේ (NPP) රජය 2024 අගභාගයේදී ආර්ථිකයේ තීරණාත්මක මොහොතක බලයට පත් වූ බැවින් ඉදිරියේදී ඉහළ ආර්ථික වර්ධනයක් අත්කර ගැනීම ප්‍රමුඛතාවයකි (විග්නරාජා, 2024). ශ්‍රී ලංකාව නිදහසින් පසු ඇති වූ දරුණුතම ආර්ථික අර්බුදයෙන් (2022-2023) ගොඩ එමින් සිටින අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2022 අප්‍රේල් මාසයේදී බාහිර ණය වගකීම් පැහැර හැරීමක් සිදුවිය (බාසු, 2022; EAF කතුවරුන්, 2023). 2018 සහ 2022 අතර ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය, දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස 84% සිට 116% දක්වා සැලකිය යුතු ලෙස වැඩි විය (රූපසටහන 2 බලන්න). ණය පැහැර හැරීමේ අවස්ථාවට පෙර වසර 15 ක කාලයක් පුරා සළකා බැලීමේ දී ශ්‍රී ලංකාවේ ණය සංයුතිය හා අවදානම සැලකිය යුතු ලෙස වෙනස් වී ඇති අතර සහනදායී මූල්‍යකරණයන් අඩුවීම, ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොළට ප්‍රවේශය අහිමි වීම, විශාල ද්විපාර්ශ්වික ණය ගැනීම් සහ ආදායම් නොමැතිකම (ස්මිත්, 2025) වැනි කරුණු ඉස්මතු වේ.


**රූපසටහන 2:** රාජ්‍ය ණය, දළ දේශීය නිෂ්පාදිතයේ % ලෙස




සටහන: e = ඇස්තමේන්තුව
මූලාශ්‍රය: IMF ලෝක ආර්ථික දැක්ම (WEO) 2025 අප්‍රේල් දත්ත සමුදාය.

මෙම ණය පැහැර හැරීම, ශ්‍රී ලංකාවේ සංවර්ධන පසුබෑමක් නියෝජනය කරයි (දුප්පත් රටක් වුවද 1970 දශකයේ මුල් භාගයේදී 'මූලික අවශ්‍යතා' සපුරාගත හැකිව තිබූ රටක් ලෙස බොහෝ විට උපුටා දක්වන ලදී) (ඉසෙන්මන්, 1980). ලෝක බැංකුව ඇස්තමේන්තු කරන්නේ දරිද්‍රතාවෙන් පෙළෙන ජනගහනයේ කොටස (ආදායම් දරිද්‍රතාව දිනකට ඇමරිකානු ඩොලර් 3.65 ක් ලෙස මනිනු ලැබේ) 2019 සහ 2023 අතර 11.3% සිට 27.1% දක්වා දෙගුණයකට වඩා වැඩි වී ඇති බවයි (රූපසටහන 3 බලන්න). මෙම ආර්ථික අර්බුදය දරිද්‍රතාව අඩු කිරීම සඳහා පසුගිය කාලයේ ලබාගත් ජයග්‍රහණයන් ආපසු හැරවූ අතර, ශ්‍රී ලංකාව 2000 දශකයේ මුල් භාගයේ ඉහළ දරිද්‍රතා මට්ටම් කරා ආපසු ගෙන ගොස් ඇත.

**රූපසටහන 3:** දිනකට ඩොලර් 3.65 ආදායම මත දරිද්‍රතා ජනගහන අනුපාතය, 2017 (ජනගහනයෙන් %)




සටහන්: e = ඇස්තමේන්තුව. 2020-2024 සඳහා ඇස්තමේන්තු ලෝක බැංකුවේ වත්මන් පුරෝකථන මත පදනම් වේ. මූලාශ්‍ර: 1985-2019 දත්ත සඳහා ලෝක සංවර්ධන දර්ශක; ලෝක බැංකු සාර්ව දරිද්‍රතා දැක්ම වාර්තාව, 2020-2021 දත්ත සඳහා 2023 ලෝක බැංකු දත්ත; සහ ලෝක බැංකු සාර්ව දරිද්‍රතා දැක්ම වාර්තාව, 2022-2024 දත්ත සඳහා 2025 ලෝක බැංකු දත්ත.

තවද, නිවාස 25,000 ක් යොදා ගනිමින් 2022-2023 සිදුකළ ජාතික පුරවැසි සමීක්ෂණය මත පදනම්ව, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) ඇස්තමේන්තු කර ඇත්තේ ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 55.7% ක් බහුමානීය වශයෙන් දරිද්‍රතා අවදානමට ලක්විය හැකි බවයි (UNDP,2023). මෙයින් අදහස් කරන්නේ මිලියන 12.3 ක තරම් දැවැන්ත ජනතාවක් ප්‍රධාන දර්ශක 12ක් සැළකීමේදී

අවම වශයෙන් තුනකින් හෝ ප්‍රශස්ථ මට්ටමින් බැහැරට තල්ලු විය හැකි බවයි. එම දර්ශක 12 සඳහා අධ්‍යාපනය, සෞඛ්‍යය, ආපදා හා ජීවන තත්වයන් යන තීරණාත්මක මානයන් ඇතුළත් වේ. කෙසේ වෙතත්, සමහර ද්විත්ව ගණනය කිරීම් මෙහි ඇතුළත් විය හැකි අතර, එමඟින් අපේක්ෂිත ප්‍රමාණයට වඩා ඉහළ අහිමි වීම් සංඛ්‍යාවක් තිබීමට ඉඩ ඇත.

මෙම අර්බුදයට හේතු සංකීර්ණ වන අතර ඉතා විශාල ලෙස විවාදයට භාජනය වේ. පුළුල් ලෙස කිවහොත්, මෙම හේතු බාහිර සහ අභ්‍යන්තර වශයෙන් වර්ග කළ හැකිය (වීරසිංහ, 2021; අබේරත්න, 2023; විග්නරාජා, 2024b. අතුකෝරල, 2025; දේවරාජන්, 2025) බාහිර සාධක අතර 2019 පාස්කු බෝම්බ ප්‍රහාරවල ප්‍රතිඵල, කොවිඩ්-19 වසංගතය, රුසියානු-යුක්රේන අර්බුදය සහ රතු මුහුදේ ගැටුම වැනි බාහිර කම්පන ඇතුළත් වේ.

අභ්‍යන්තර සාධක අතරට ආර්ථිකය, වෙළඳාම් කළ හැකි නිෂ්පාදන සහ අපනයන වර්ධනයට ප්‍රමාණවත් ලෙස සකස් නොවීම, අඩු ප්‍රතිලාභ සහිත යටිතල පහසුකම් ව්‍යාපෘති රාශියක් සඳහා වාණිජ ණය ගැනීම (උදා: හම්බන්තොට වරාය සහ මත්තල ගුවන්තොටුපළ), මූල්‍ය හා ගෙවුම් ශේෂ හිඟයන් අඛණ්ඩව පැවතීම සහ 2019-2022 කාලය තුළ උග්‍ර වූ වැරදි ආර්ථික කළමනාකරණය ("දේශීය විසඳුම්" ලෙස හඳුන්වමින්), ඵලදායිතා වර්ධනය කෙරෙහි අවධානය යොමු නොවීම සහ වෙළඳපල සඳහා ව්‍යවසායකයන්ගේ සහ පුරවැසියන් කෙරෙහි රජයේ වගවීම සීමිත වීම යන කරුණු අයත් වේ.

බාහිර සාධකවලට වඩා අභ්‍යන්තර සාධක මෙම අර්බුදයට වැඩි දායකත්වයක් දැක්වූ බවට එකඟතාවයක් ඇතිවෙමින් පවතී. ජනාධිපති දිසානායක මැතිතුමා සහ ජාතික ජන බලවේගය සියලු ශ්‍රී ලාංකිකයින්ට අර්බුදයෙන් මිදීමට පැහැදිලි මාර්ගයක් පොරොන්දු වෙමින් සහනුකම්පාව සහ දූෂණයෙන් තොර පාලනයක් යන තේමාවන් මත මැතිවරණ ප්‍රචාර කටයුතු කළහ (NPP, 2024).


# 3. කැපී පෙනෙන ආර්ථික ස්ථාවරත්වයක් - නමුත් අවදානම් පවතී

ශ්‍රී ලංකාවේ මෑත කාලීන ආර්ථික දැක්ම ප්‍රවේශමෙන් ශුභවාදී වීමට හේතු සපයයි (විග්නරාජා සහ ටී වෙල්ඩේ, 2025). ශ්‍රී ලංකා මහ බැංකුවේ විචක්ෂණශීලී මූල්‍ය හා මූල්‍ය ස්ථායිතා ප්‍රතිපත්ති, ඩොලර් බිලියන 3 ක සිව් අවුරුදු ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන සහ ඉන්දියාවෙන් ලැබුණු ඩොලර් බිලියන 4 ක ණය ආධාර හේතුවෙන්, දැඩි සාර්ව ආර්ථික කැලඹීම් වලින් පසු ආර්ථිකය ස්ථාවර වෙමින් පවතින බව පෙනේ (වීරසිංහ, අමරසේකර සහ ජෙගජීවන්, 2025; බෲයර් සහ වොල්ඩෙම්චෙල්, 2025). ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහනට කැපවී සිටීම සම්බන්ධයෙන් ගෞරවයට පාත්‍ර විය යුතුය. එලෙසම සමාජ වියදම් වැඩි වීම කළමණාකරනය කළ යුතු අතර, මෑතදී ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණවීම වඩා යහපත් තත්වයක් උදා කරයි. පුද්ගලික බැඳුම්කර හිමියන් සහ චීනය සමඟ ඇති කරගත් ඩොලර් බිලියන 17.5 ක ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුම් මගින් අවශ්‍ය ඉඩ ලබා දී ඇති අතර සංචාරක ව්‍යාපාරයේ පුනර්ජීවනය විසින් විදේශ විනිමය සංචිත ඉහළ නංවා ඇත (මුදල්, ආර්ථික ස්ථාවරත්වය සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය, 2024). 2022 අප්‍රේල් සහ 2025 මැයි මාසවල ස්වෛරී ණය පැහැර හැරීම අවම මට්ටමක සිට දළ නිල සංචිත (ඇමරිකානු ඩොලර්) ක්‍රමයෙන් ඉහළ යාම රූප සටහන 4 හි දැක්වේ. 2021 දී මුලින් අත්සන් කරන ලද චීන මහජන බැංකුව (PBoc) සමඟ වූ විදේශ විනිමය හුවමාරු පහසුකම මෙම දත්ත වලින් බැහැර කර ඇති අතර එය ඩොලර් බිලියන 1.4 ක් පමණ වේ. 2024 දෙසැම්බර් මාසයේදී ගිවිසුම අලුත් කරන ලද අතර, චීන මහජන බැංකුවේ හුවමාරු පහසුකම තවත් වසර තුනකට දීර්ඝ කරන ලදී. දළ විදේශ සංචිත පෙර වසරේ ආනයන ආවරණයේ මාස තුනකට වඩා ඉහළ ගිය පසු හුවමාරු පහසුකම භාවිතා කළ හැකිය.

2025 පෙබරවාරි මැද භාගයේ ඉදිරිපත් කල නව රජයේ පළමු අයවැය මඟින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයක් ඇති කිරීම සහ ආර්ථික ප්‍රතිසංස්කරණ ප්‍රයත්නයන් අඛණ්ඩව පවත්වාගෙන යාමට යෝජනා

කරයි. එය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහනේ අවශ්‍යතා සපුරාලීම සහ සමලෙස ව්‍යාප්ත වූ වර්ධනයක් සඳහා වන ජනවරම ඉටු කිරීම යන කරුණු සමතුලිත කිරීමට ගන්නා නව රජයේ ප්‍රායෝගික උත්සාහය ඉස්මතු කරයි. ක්‍රමානුකූල රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයක් ඇති කිරීම, සමාජ සුභසාධනය සහ අධ්‍යාපනය සඳහා වියදම් වැඩි කිරීම, ඩිජිටල් ආර්ථිකය වැඩිදියුණු කිරීම සඳහා වන ප්‍රතිසංස්කරණ, ණය ආපසු ගෙවීම් සහ ආර්ථික ස්ථාවරත්වය සපුරාලීම මධ්‍යයේ ආදායම් ඉහළ නැංවීමට පියවර ගැනීම කෙරෙහි ද අයවැයෙන් අවධානය යොමු විය (ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, 2025). මෙම පියවරයන් හරහා, නව රජය මධ්‍ය කාලීනව 5% ක ආර්ථික වර්ධනයක් අපේක්ෂා කරයි.

**රූපසටහන 4:** දළ නිල සංචිත (චීන මහජන බැංකුව සමඟ වූ හුවමාරු පහසුකම හැර)





මූලාශ්‍රය ශ්‍රී ලංකා මහ බැංකුව

නව රජයට හිමිවූයේ ස්ථාවර වෙමින් පවතින ආර්ථිකයකි. රූපසටහන 5 පෙන්නුම් කරන්නේ 2023 සහ 2024 අතර වර්ධනය -2.3% සිට 5.0% දක්වා ඉහළ ගිය බවයි. 2025 මුල් භාගයේ දී අඛණ්ඩව ඉහළ නැඟීමක් පෙන්නුම් කරමින් 2025 ප්‍රථම කාර්තුව තුළ 4.8%ක වර්ධනයක් පිළිබිඹු විය. කෙසේ වෙතත්, අයවැයෙන් පසුව ප්‍රකාශයට පත් කරන ලද ජාතික මූල්‍ය අරමුදලේ පුරෝකථන අනුව ආර්ථික වර්ධනය 2024 සහ 2025 අතර 4.5% සිට 3.0% දක්වා මන්දගාමී වීමෙන් පසුව 2030 දක්වා ඉදිරි වසර 5 තුළ එම අගය 3% ක් පමණ පවතිනු ඇත (IMF, 2025).

ලෝක බැංකු අනාවැකි අනුවද 2024 දී 5.0% සිට 2025 දී 3.5% දක්වා ආර්ථික වර්ධනය මන්දගාමී වන බව පෙන්වා දේ (ලෝක බැංකුව, 2025b). කෙසේ වෙතත්, ඉදිරි මාවත තවමත් අවිනිශ්චිතතාවයෙන් පිරී ඇත. මෙම අවිනිශ්චිතතාවය ජය ගැනීමට හොඳම ක්‍රමය වන්නේ විභව අවදානම් අවම කරන ශක්තිමත් ආර්ථික වර්ධන සැලැස්මක් ඇතිකරගැනීම බව පැහැදිලිය.

**රූපසටහන 5:** ශ්‍රී ලංකාවේ වාර්ෂික සහ කාර්තුමය දළ දේශීය නිෂ්පාදිත වර්ධන අනුපාත




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා

ආර්ථික දැක්ම ධනාත්මක වුවද, නව රජය මුහුණ දිය යුතු අවදානම් තිබේ. එක් සැලකිය යුතු අවදානමක් ශ්‍රී ලංකාවට බාහිරින් පැමිණ තිබේ. මෙය අනපේක්ෂිත ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්ති පිළිබඳ කාරණයකට  සම්බන්ධ වන අතර, එහිදී එක්සත් ජනපද පරිපාලනයේ තීරුබදු ඉහළ නැංවීමේ ප්‍රතිපත්ති සහ චීනය කෙරෙහි දැඩි ප්‍රතිපත්ති මෙන්ම වෙළඳ හවුල්කරුවන්ගේ දැඩි තරඟකාරී ක්‍රියාමාර්ග, ඉන්දු-පැසිෆික් කලාපයේ භූ ආර්ථික විද්‍යාවට බලපාන අතර වෙළඳ යුද්ධයකට මඟ පෑදිය හැකිය (ටකාඩා, 2025). 2025 අප්‍රේල් 2 වන දින, ඇමෙරිකා එක්සත් ජනපදයට සාපේක්ෂව වෙළඳ අතිරික්තයක් ඇති ශ්‍රී ලංකාවට ජාතික වෙළඳ බාධක සහ විනිමය අනුපාත ප්‍රතිපත්තිය ඇතුළත් සූත්‍රයක් මත පදනම්ව 44%ක ප්‍රතිලෝම තීරුබදු ප්‍රකාශයට පත් කළේය.

ඇමෙරිකා එක්සත් ජනපදය නිවේදනය කළ පරිදි අන්‍යෝන්‍ය තීරුබදු ක්‍රියාත්මක කළහොත්, ශ්‍රී ලංකාවට අපනයන තරඟකාරීත්වය අහිමි වීමට ඉඩ ඇති අතර එය සමස්ථ අපනයනවලින් හතරෙන් එකකට බලපායි. ඊට අමතරව, බොහෝ තරඟකාරී රටවල් හා සසඳන විට අප රටට අවාසියකට මුහුණ දීමට සිදුවිය හැක, එම රටවල් ශ්‍රී ලංකාවට පනවා ඇති තීරුබදු වලට වඩා අඩු තීරුබදු ප්‍රතිශතයකට යටත් වනු ඇත.

ශ්‍රී ලංකා ආර්ථිකයට ඇතිවන බලපෑම් විනිශ්චය කිරීමට තවමත් කල් වැඩි වුවත්, සමස්ත දිශාව විදේශ විනිමය ඉපැයීම් කෙරෙහි සෘණාත්මක වන අතර එය ආර්ථික වර්ධනය, රැකියා සහ දරිද්‍රතාව කෙරෙහි බලපෑම් ඇති කරයි. මෙය 1930 ගණන්වල අඳුරු ගෝලීය ආර්ථික වාතාවරණ තත්ත්වයන්ට හා අවසානයේ ගැඹුරු ගෝලීය ආර්ථික අවපාතයකට නැවත පැමිණීමක් විය හැකි බව ඇතැමුන්ගේ අදහසයි. එබැවින්, අවිනිශ්චිත ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්ති වලට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකාවට වඩාත් ඔරොත්තු දෙන ප්‍රවේශයක් අවශ්‍ය වේ.

අනෙකුත් ගැටළු ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර සාධක වේ. නිදසුනක් වශයෙන්, පෞද්ගලික සහ නිල ණයහිමියන් සමඟ ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුම තිබියදීත්, රාජ්‍ය ණය මට්ටම් ඉහළ මට්ටමක පැවතිය හැකිය (වත්මන් IMF වැඩසටහන අවසන් වීමෙන් පසු 2027 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් 95% ක් පමණ). විදේශ විනිමය තත්ත්වයට බලපාන ආනයන සීමාවන් ඉවත් කිරීමෙන් පසු ජීවන වියදම ඉහළ යාම සහ මෝටර් රථ ආනයනය අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා ඉහළ යාම පිළිබඳව සැලකිලිමත් විය යුතු අතර රාජ්‍ය අංශයේ වෘත්තීය සමිතිවලින් අධික වැටුප් ඉල්ලීම් ඇතිවීමේ අවදානමක් පවතී (ෆිච් ශ්‍රේණිගත කිරීම්, 2025).

තවත් අවදානමක් වන්නේ වේගයෙන් වයස්ගත වන ශ්‍රී ලාංකික ජනගහනයේ අහිතකර ජන විකාශන තත්ත්වයන් මධ්‍යයේ දක්ෂ වෘත්තිකයන් පිටතට ගලා යාමයි. 2022 දී පමණක්, තොරතුරු තාක්ෂණ, බැංකු, අලෙවිකරණ සහ වෛද්‍ය වෘත්තිකයන් ඇතුළු පුද්ගලයින් 300,000 ක් විදේශයන්හි වඩා හොඳ අවස්ථා සොයමින්

සංක්‍රමණය වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත (ශ්‍රී ලංකා විදේශ රැකියා කාර්යාංශය, 2024). ආර්ථික වර්ධනය වේගවත් කිරීම සඳහා අවශ්‍ය කුසලතා සංචිතයේ හිගය වර්ධනය වීමකට රට මුහුණ දෙන බැවින්, මෙම බුද්ධි ගලනය ව්‍යාපාර සහ පරිපාලනය යන දෙකටම බරපතල අභියෝගයක් එල්ල කරයි (කළුආරච්චි, ජයතිලක සහ රෙහ්මාන්, 2024). ශ්‍රී ලංකාවේ ආගමන සහ සංක්‍රමණ ප්‍රතිපත්ති මඟින් නැවත ඇතුළුවීමකින් තොරව පිටවීමට පමණක් ඉඩ සලසන අතර එමඟින් රටට මානව සම්පත් අහිමි වේ.

බාහිර සංක්‍රමණයට බාධක දැමීම වෙනුවට, වඩාත් නම්‍යශීලී ශ්‍රම වෙළඳපොළ තත්ත්වයන් යටතේ රැඳී සිටීමට කුසලතා ඇති වෘත්තිකයන් දිරිමත් කරන පරිසරයක් නිර්මාණය කිරීම ඉතා වැදගත් වේ. මේ සඳහා ඔවුන්ගේ කුසලතා භාවිතය දිරිමත් කරන, තරඟකාරී වැටුප් සහ ප්‍රතිලාභ ලබා දෙන සහ ස්ථාවර අනාගතයක් පෝෂණය කරන ආර්ථික වර්ධන සැලැස්මක් අවශ්‍ය වේ. ඊට අමතරව, රටේ මානව සම්පත් දියුණුව සඳහා තීරණාත්මක අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන, කුසලතා හිඩැස් පියවීම සඳහා 'විදේශීය කුසලතා' ආකර්ෂණය කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සැකසීම වටී. දිගු කාලීනව වර්ධන ගම්‍යතාවය පවත්වා ගැනීම සඳහා මෙය වැදගත් වේ.

# 4. වර්ධන සැලැස්මක ප්‍රධාන අංග සහ ප්‍රතිපත්ති

ES 1 වගුවේ ඇති වර්ධන සැලැස්ම මූලික ප්‍රතිපත්ති ක්ෂේත්‍ර හයකින් සමන්විත වේ:

1. සාර්ව ආර්ථික ස්ථාවරත්වය දිගටම පවත්වාගෙන යාම සහ විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම
2. ගෝලීය සැපයුම් දාම, අපනයන සහ විදේශ සෘජු ආයෝජන ප්‍රවර්ධනය කිරීම
3. නිෂ්පාදන සාධක වෙළෙඳපොළ වැඩිදියුණු කිරීම
4. අංශික සහ වෙළඳපොළ-නිශ්චිත ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
5. දරිද්‍රතාව අඩු කිරීම සඳහා පවතින ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීම
6. ආර්ථික වර්ධන ප්‍රතිපත්ති වටා දේශපාලන සම්මුතිය සහ රාජ්‍ය ධාරිතාව ගොඩනැගීම

මෙම කොටස යහපත් සාර්ව ආර්ථික ප්‍රතිපත්ති(4.1), ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ කිරීම (ගෝලීය සැපයුම් දාම, වෙළඳාම සහ විදේශ සෘජු ප්‍රවර්ධනය කරන ඒවා මෙන්ම සාධක වෙළඳපල වැඩිදියුණු කිරීම ඇතුළුව)(4.2) සාකච්ඡා කරයි. එය ආංශික ප්‍රතිපත්ති (4.3) සහ දරිද්‍රතාව අඩු කිරීම සඳහා පවතින ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීමට (4.4) උදාහරණ සපයයි.

## 4.1 යහපත් සාර්ව ආර්ථික ප්‍රතිපත්තිය

ඵලදායී වර්ධන සැලැස්මකට යහපත් සාර්ව ආර්ථික මූලිකාංග වලින් සමන්විත ශක්තිමත් පදනමක් අවශ්‍ය වේ. මේ සඳහා, ශ්‍රී ලංකාව වරින් වර ඇතිවන සාර්ව ආර්ථික ආතති චක්‍රවලින් මිදිය යුතුය. මේ සම්බන්ධයෙන්, නව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත (2024) සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන යටතේ මූල්‍ය නීති දැඩි කිරීම මගින්, තිරසාර නොවන රාජ්‍ය මූල්‍ය හිඟයන් විසඳා ඇත. මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය කිරීම ශක්තිමත් කළ

යුතුය. බදු ආදායම ඉහළ ගියද, ජනප්‍රියවාදී වියදම් යෝජනා ප්‍රසාරණය කිරීමට ඉඩ නොදී, එය අඛණ්ඩව පැවැතීම සහතික කළ යුතුය. මීට පෙර පැවති රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වගකීම් පනතේ (2003) මෙන් නොව, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස: ප්‍රාථමික අතිරික්තය 2.3%, ආදායම 15% සහ ප්‍රාථමික වියදම් 13% ලෙසින් දැන් වාර්ෂික ඉලක්ක ඇත. සාර්ව ආර්ථික ස්ථාවරත්වය ළඟා කර ගැනීමේ වැදගත්ම අංගය ලෙස ආදායම පදනම් කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය කිරීම පවතී. ඊට අමතරව, ආදායම් ඉපැයීමේ රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය කිරීම මේ සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කිරීමට දායක වේ.

නව රජය මුහුණ දෙන වඩාත්ම මතභේදාත්මක ගැටළු වලින් එකක් ලෙස රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය පවතී. අද වන විට, ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය ගුණකයන්ගේ වර්ධනය සහ සංවර්ධන බලපෑම් කෙරෙහි අවධානය යොමු වී ඇත්තේ ඉතා අල්ප වශයෙනි (එනම් රාජ්‍ය මූල්‍ය විචක්ෂණභාවය වඩාත් තහවුරු කරමින් වර්ධනයට සහාය වන ඉලක්කගත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති). මෙය පර්යේෂණ සහ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සඳහා වැදගත් ක්ෂේත්‍රයකි. එමෙන්ම රාජ්‍ය ආදායම වැඩි වී ඇති අතර, බොහෝ දුරට ආර්ථිකය තුළ රාජ්‍යයේ පුළුල් භූමිකාව නිසා රජයේ වියදම් තාර්කික කිරීම ප්‍රමුඛතාවයක් ලෙස පවතී.

වත්මන් රජය, රාජ්‍ය ව්‍යවසායන් (SOE) කළමනාකරණය තුළින් වැඩිදියුණු කිරීමට සැලසුම් කරයි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකන් ගුවන් සේවය වැනි විශාල පාඩු ලබන රාජ්‍ය ව්‍යාපාර කිහිපයක් පෞද්ගලීකරණය කිරීම හෝ ප්‍රතිව්‍යුහගත කිරීම කෙරෙහි නැවත සලකා බැලිය යුතු වේ. මන්ද ඒ වැනි ආයතන විසින් මහජන අරමුදල් නිසි අයුරින් පරිහරනය නොකිරීම හේතුවෙන් දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වයට තර්ජනයක් වන බැවිනි. ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල සහාය ඇතිව, රාජ්‍ය යාන්ත්‍රණය නිසි ලෙස ප්‍රමාණගත කරන සහ පෞද්ගලික අංශයේ නායකත්වයෙන් යුත් ආර්ථික වර්ධනය දිරිමත් කරන සහ ඉදිරි වසරවලදී රාජ්‍ය මූල්‍ය තත්වයේ යහපත් බව සහතික කරන උපාය මාර්ගයක් අනුගමනය කළ යුතුය.

සුදුසු මුදල් සහ මූල්‍ය ප්‍රතිපත්ති ද වර්ධන සැලැස්මක තීරණාත්මක අංග වේ. 2023 මහ බැංකු පනත මඟින් නම්‍යශීලී විනිමය අනුපාත

ප්‍රතිපත්තියක් සමඟ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය සඳහා රාමුවක් සපයයි. තවද, මහ බැංකු ස්වාධීනත්වය සහ වගවීමේ විධිවිධාන හේතුවෙන් මහ බැංකුව රජයට මුදල් සැපයීම වළකන අතර, රට තුළ වඩා හොඳ මූල්‍ය විනයක් සහ සංචිත/සාර්ව ආර්ථික ආවරණයන් සහතික කරයි.

මුදල් ප්‍රතිපත්තිය අවදානමට ලක් කළ සහ සාර්ව ආර්ථික ආතතිය සංකීර්ණ කළ රාජ්‍ය මූල්‍ය බලය, 2023 මහ බැංකු පනත හරහා විසඳා ඇත. එසේ විසදා ඇත්තේ මහ බැංකුවේ පාලන ව්‍යුහයන් තුළ මහ භාණ්ඩාගාරයේ බලපෑම ඉවත් කිරීම; මහ බැංකුව අයවැය හිඟය පියවා ගැනීම සඳහා මුදල් සැපයීම වැළැක්වීම; මුදල් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා, දත්ත මත පදනම් වූ ඉදිරි දැක්මක් සහිත නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය (FIT) අනුගමනය කිරීමෙන් ප්‍රතිපත්ති පොලී අනුපාත හරහා රාජ්‍ය මූල්‍යට ඇති පීඩනය වැළැක්වීම; සහ නම්‍යශීලි උද්ධමන ඉලක්කකරණය යටතේ අවශ්‍ය පරිදි බාහිර ගිණුමට වන පීඩනයට එදිරිව පළමු ආරක්ෂක මාර්ගය ලෙස විනිමය අනුපාතයේ නම්‍යශීලී කළමනාකරණය අනුගමනය කිරීම යන පියවර හරහායි. වෙනත් අයුරකින් කිවහොත්, නීතිවල ඇතුළත් කළ ඇති පැහැදිලි රාමු මත පදනම් වු සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයේ නව ආදර්ශය අඛණ්ඩව පවත්වා ගත යුතුය.

ඊට අමතරව, රාජ්‍ය ණය කළමණාකරනය සදහා ඇති විසිරීගිය ආයතනික ව්‍යුහය වෙනුවට ඒකාබද්ධ ණය කළමනාකරණ කාර්යාලයක් පිහිටුවීමෙන් ණය කළමනාකරණය ශක්තිමත් කර ඇති අතර එය තිරසාර ප්‍රතිඵල ලබා දෙන වඩාත් උපායමාර්ගික ප්‍රවේශයකට හිතකර විය හැක.

මේ සමඟම, ඉහළ වර්ධන අංශ සහ කුඩා ව්‍යාපාර සඳහා සහාය වීමට මූල්‍ය අංශය සංවිධානය කර දිරිමත් කළ යුතුය. මෑතකදී ජාතික ණය ඇපකර ආයතනය පිහිටුවීම නිවැරදි දිශාවට තැබූ වඩා හිතකර පියවරකි. ණය ලකුණු (Credit Scores), සුරක්ෂිත ගනුදෙනු ලේඛනය (Secured Transaction Registry) වැනි මෙවලම් ඇතුළුව ශ්‍රී ලංකාවේ ණය තොරතුරු කාර්යාංශයේ (CRIB) සම්පූර්ණ විභවය භාවිතා කිරීම, හිතකර ණය සංස්කෘතීන් ගොඩනැගීමට පහසුකම් සපයයි. පවතින බැංකු සහ බැංකු නොවන මූල්‍ය පද්ධතිය


ප්‍රමාණවත්ද නැතහොත් නව සංවර්ධන මූල්‍ය ආයතනයක් අවශ්‍යද යන්න තීරණය කිරීම සඳහා ගෝලීය යහපත් භාවිතයන් උපයෝගී කරගනිමින් තවදුරටත් පර්යේෂණ අවශ්‍ය වේ. සෘණාත්මක ආර්ථික කම්පනවලට ඔරොත්තු දීමට බැංකුවලට ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් තිබේද යන්න තීරණය කිරීම සඳහා බැංකුවල ආතති පරීක්ෂණ සඳහා ගෝලීය යහපත් භාවිතයන් අඛණ්ඩව භාවිතා කිරීම ද ඉතා වැදගත් වේ. තවද, පවතින බැංකු ඒකාබද්ධ කිරීම/තාර්කිකකරණය සහ ඒවායේ ව්‍යාපාර ආකෘති සමාලෝචනය කිරීම, කාර්යක්ෂමතාව/ඵලදායිතාව වැඩි දියුණු කිරීමට සහ ගනුදෙනු පිරිවැය අඩු කිරීමට දායක වේ.

## 4.2 ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ[2]

දරිද්‍රතාවයේ තියුණු වැඩිවීම සහ බහුමාන අවදානම ආපසු හැරවීමට (ගුණතිලක 2024) සහ 2027/28 දී තවත් ණය ප්‍රතිව්‍යුහගත කිරීමක් වළක්වා ගැනීමට 5% ඉක්මවන ආර්ථික වර්ධනයක් අවශ්‍ය වේ. කෙසේ වෙතත්, විභව මධ්‍ය කාලීන වර්ධන වේගය දැනට ඇස්තමේන්තු කර ඇත්තේ 3% ක් පමණ වනු ඇති බවයි (IMF 2025). එබැවින්, ආර්ථිකයේ වර්ධන රාමුව ශක්තිමත් කිරීම සඳහා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ කෙරෙහි දැඩි අවධානයක් යොමු කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම දිගුකාලීන ප්‍රතිසංස්කරණ අතරට නිෂ්පාදන සාධක වෙළඳපොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය කිරීම, ආයෝජන වාතාවරණය වැඩිදියුණු කිරීම, ආයෝජන ප්‍රවර්ධනය ශක්තිමත් කිරීම, වෙළඳ ගිවිසුම් ඇතුළු වෙළඳ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය කිරීම, වෙළෙඳාම සඳහා ඇති පහසුකම් සැපයීම මෙන්ම අධ්‍යාපනය, පුහුණුව සහ කුසලතා සංවර්ධනය ඇතුළත් වේ.

2 මෙම වාර්තාවේ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ යන පදය පුළුල් අර්ථයකින් භාවිතා කර ඇති අතර එය ආර්ථිකය පරිවර්තනය කිරීමට සහ ඉහළ ඵලදායිතා ක්‍රියාකාරකම් කරා ගමන් කිරීමට උපකාරී වන ප්‍රතිපත්ති පරාසයක් අදහස් කෙරේ.

**රූපසටහන 6:** ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සඳහා ප්‍රයෝජනයට නොගත් විභවය - වෙළඳාම සහ ආයෝජනය




මූලාශ්‍රය: ලෝක සංවර්ධන දර්ශක

ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ආර්ථික ප්‍රතිපත්ති ද ඒ හා සමානව වැදගත් වේ. අයහපත් සාර්ව ආර්ථික අසමතුලිතතාවයන් සහ ආර්ථික අර්බුදය පැවති සමයේ පැවති, විදේශ විනිමය උපයා ගැනීම සඳහා වූ ප්‍රතිපත්ති රාමුව (අපනයන, විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම, සංචාරක ව්‍යාපාරය සහ ප්‍රේෂණ හරහා) ඵලදායී නොවීය. නිදසුනක් වශයෙන්, ආර්ථිකය අර්ධ වශයෙන් වෙළඳාමට විවෘත කිරීම සහ අධික ලෙස අගය කරන ලද විනිමය අනුපාතය - ශක්තිමත් අභ්‍යන්තර ව්‍යාපාරික කාණ්ඩවල බලපෑම් හේතුවෙන් - ශ්‍රී ලංකාවේ වෙළඳ පාලන තන්ත්‍රය අපනයන අධෛර්යමත් කරන පිළිවෙතක් දිගටම පෙන්නුම් කිරීමට හේතු වී තිබේ. දිගුකාලීන බදු සහ ආනයන බදු නිදහස් කිරීම්, විදේශ සෘජු ආයෝජන ගලා ඒම් කෙරෙහි එතරම් බලපෑමක් කර නොමැත. ණය නොවන විදේශ විනිමය උපයන මූලාශ්‍ර හඳුනා ගැනීම සඳහා පුළුල් හා ඒකාබද්ධ ජාතික උපාය මාර්ගයක් අනුගමනය කළ යුතුය. මෙය අවධාරණය කළ යුත්තේ:

- වඩාත් ඵලදායී අපනයන අලෙවිකරණය සහ වඩාත් යථාර්ථවාදී විනිමය අනුපාතයක් හරහා ආනයන ආරක්ෂාව ක්‍රමයෙන් අඩු කිරීමත් සමඟ වෙළඳ තන්ත්‍රයේ අපනයන අධෛර්යමත් කිරීමේ නැඹුරුව අඩු කිරීම
- වඩා හොඳ ඉලක්කගත ආයෝජන ප්‍රවර්ධනය, කාලානුරූපී ආයෝජන දිරිගැන්වීම් සහ අනුමත කිරීමේ ක්‍රියාවලීන් ඩිජිටල්කරණය කිරීම හරහා එයට ඇති බාධා ඉවත් කිරීම.

ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය වැඩි කිරීම සඳහා ආයෝජන, තාක්ෂණ හුවමාරුව, අපනයන සඳහා වෙළෙඳපොළ ප්‍රවේශය සහ වේගයෙන් දියුණු වන ප්‍රධාන ආර්ථිකයක් සමග සහයෝගීතාවය යන ප්‍රතිලාභ ලබා ගැනීමට, අසල්වැසි ඉන්දියාව සමග ආර්ථික සබඳතා ශක්තිමත් කිරීම වැදගත් වේ. 2024 දෙසැම්බර් මාසයේදී ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාගේ ඉන්දීය සංචාරය සහ 2025 අප්‍රේල් මාසයේදී ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය රටවල් දෙක අතර ශක්තිමත් ද්විපාර්ශ්වික සබඳතා සඳහා පදනමක් සපයයි. ඉහළ වර්ධන අංශවල ව්‍යාපාර-ව්‍යාපාර අතර (B-B) සම්බන්ධතා, රටවල් දෙක අතර බලශක්ති ව්‍යාපෘති, ඩිජිටල් හැඳුනුම්පත් යෝජනා ක්‍රමයක්, ශ්‍රී ලංකාවේ දේශීය ගනුදෙනු සඳහා ඉන්දියානු රුපියල භාවිතා කිරීමට ඉඩ සැලසීම සහ සාකච්ඡා යටතේ පවතින ගැඹුරු ද්විපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම වැනි ක්ෂේත්‍රවල සංයුක්ත ප්‍රගතියක් ලබා ගැනීම කෙරෙහි දැන් අවධානය යොමු කළ යුතුය (විග්නරාජා සහ ක්‍රිපලානි, 2024)[3]. කලාපීය සහයෝගීතාවය සහ ඒකාබද්ධතාවය පෝෂණය කර ඇති කුඩා අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමයේ (ASEAN) රටවල් සමඟ ජපානයේ සම්බන්ධතාවය, එවැනි උත්සාහයන් සඳහා වටිනා ආකෘතියක් ලෙස පෙන්වා දිය හැක (කොජිමා, 2000). මෙය වෙනත් දේ අතර, ගෝලීය සැපයුම් දාම සහ අග්නිදිග ආසියාවේ රැකියා අවස්ථා වැඩි කිරීමට සහ කලාපීය වෙළඳාම සහ මූල්‍ය සහයෝගීතාව සඳහා රාමුවක් ඇති කිරීමට හේතු වී තිබේ.

ශ්‍රී ලංකාවට ඉන්දියාව, චීනය, කොරියාව, අග්නිදිග ආසියාව, යුරෝපා සංගමය සහ ඇමරිකා එක්සත් ජනපදය යන රට වලින් ලැබෙන සැලකිය යුතු සංවර්ධන සහයෝගය, වෙළඳපොළ ප්‍රවේශය සහ සංචාරකයන්ගේ පැමිණීම වැඩි කිරීමට හැකි වන පරිදි නොබැඳි විදේශ ප්‍රතිපත්තියක් දිගටම පවත්වාගෙන යාම ද වැදගත් වේ.

3 ODI විසින් සිදු කරන ලද ආකෘති නිර්මාණ කටයුතුවලින් පෙනී යන්නේ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර නිදහස් වෙළඳ ගිවිසුමක් (FTI) හරහා තීරුබදු ලිහිල්කරණයෙන් ශ්‍රී ලංකාවට ආර්ථික වාසි ලැබිය හැකි බවයි. විග්නරාජා සහ ටී වෙල්ඩේ (2025) බලන්න, රචනාව 10.

## 4.3 විභවතාවයක් සහිත ඉහළ ආර්ථික වර්ධන අංශ

සාර්ථක ආර්ථික වර්ධන සැලැස්මක් සඳහා ඉහළ වර්ධන විභවයක් ඇති අංශ මොනවාදැයි සලකා බැලීම සහ එම අංශ වලට සහාය දීම අවශ්‍ය වේ. මේ සඳහා බලධාරීන් සහ අදාළ රාජ්‍ය ආයතන විසින් අංශ තෝරා ගැනීමේ දී ඒ වටා ඇති දත්ත සහ ප්‍රායෝගික සාක්ෂි පිළිබඳ ගැඹුරු තක්සේරුවක් කිරීම අවශ්‍ය වේ. ආර්ථික වර්ධන අධ්‍යයන කණ්ඩායමේ මූලික විමසීම් වලින් පෙනී යන්නේ සංචාරක ව්‍යාපාරය, කෘෂිකර්මාන්තය, නිමැයුම් කර්මාන්ත, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ ඩිජිටල් ආර්ථිකය වැනි සාපේක්ෂ වාසි සහිත ක්ෂේත්‍ර කිහිපයක් තිබෙන බවයි.

### 4.3.1 සංචාරක කර්මාන්තය

වර්තමානයේ සංචාරක ක්ෂේත්‍රය, වඩා යහපත් තත්වයක් උදා කර ඇත. එය දිගු කලක් ශ්‍රී ලංකාවට තීරණාත්මක අංශයක් වී ඇති අතර ආර්ථික අර්බුදයෙන් පසු ශක්තිමත් ප්‍රකෘති වීමක්ද පෙන්නුම් කරයි. 2024 දී ශ්‍රී ලංකාවට සංචාරකයින් මිලියන 2 කට අධික සංඛ්‍යාවක් පැමිණි අතර, එය 2023 ට වඩා 38% ක වැඩිවීමකි (ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, 2024). සංචාරක ව්‍යාපාරය විදේශ විනිමය සංචිත ඉහළ නැංවීමට සහ ආර්ථික වර්ධනය වේගවත් කිරීමට සැලකිය යුතු විභවයක් ලබා දෙයි. කෙසේ වෙතත්, සංචාරක ව්‍යාපාරයේ තිරසාර බව සහතික කිරීමට සහ කොළඹින් ඔබ්බට යමින්, ප්‍රජාවන්ට ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කළ යුතුය. බහු සංස්කෘතික ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව වඩා හොඳින් අලෙවි කිරීම, රටේ උතුරු හා නැගෙනහිර වැනි අඩු සංචාරක කලාප අවශ්‍ය ලෙස සංවර්ධනය කිරීම සහ කුඩා හෝටල්, අවන්හල් සහ සුවතා සේවාවන් වැනි සංචාරක ක්‍රියාකාරකම්වලට සම්බන්ධ කුඩා ව්‍යාපාර සඳහා සහාය දීම අත්‍යවශ්‍ය වන අතර, එය වඩාත් සමබර හා විමධ්‍යගත සංචාරක කර්මාන්තයක් නිර්මාණය කිරීමට උපකාරී වනු ඇත.

තවද, මෑත කාලීනව සංචාරකයින්ට ඇතිවූ හිරිහැර නිසා සංචාරකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම ද අත්‍යවශ්‍ය වේ (අබේරත්න 2025). පරිසරය, ප්‍රතිපත්ති සහ නියාමන කොන්දේසි, යටිතල පහසුකම් සහ සේවා, ගමනාගමනය සහ සංචාරක කර්මාන්තයේ සම්පත් සහ තිරසාර තත්ත්වය යන සංචාරක කර්මාන්තය සංවර්ධනය සම්බන්ධ සියලුම ප්‍රධාන ක්ෂේත්‍රවල ප්‍රමිතියෙන් තොර කාර්ය සාධනය හේතුවෙන් ශ්‍රී ලංකාව 2024 ගෝලීය සංචාරක සංවර්ධන දර්ශකයේ පහළ ශ්‍රේණිගත කිරීමක් ලබා ඇත. කලාපීය සංචාරක ගමනාන්තයක් ලෙස රටේ තරඟකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා, රජය මෙම අඩුපාඩු සපුරාලීමට සහ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමට ක්‍රියාශීලී පියවර ගත යුතුය.

## 4.3.2 කෘෂිකර්මාන්තය

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය ආර්ථික වශයෙන් අහිතකර කුඩා ඉඩම්, අකාර්යක්ෂම වැවිලි, අඩු තාක්ෂණය, නුපුහුණු මිනිස් බලය සහ ප්‍රාග්ධනය නොමැතිකම  යන ලක්ෂණ වලින් සමන්විත වේ. එය ශක්‍යතාවයෙන් පවත්වා ගෙන යනු ලබන්නේ යෙදවුම් සඳහා සහනාධාර, පොහොර, මිල සහාය සහ වාරිමාර්ග මෙන්ම රජයේ මැදිහත් වීම් හරහා පමණි. සුවිශේෂී කරුණ නම්, ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායෙන් හතරෙන් එකක් පමණ කෘෂිකාර්මික අංශයේ යෙදී ඇත්තේ එය වඩා හොඳ රැකියා අවස්ථාවක් නිසා නොව වෙනත් අංශ වල ඇති අවස්ථාවන් ඉතා අඩු නිසාය. මීට අමතරව, 1970 ගණන්වල වතුකරයේ ඉඩම් ප්‍රතිසංස්කරණ, කෘෂිකාර්මික කාර්යක්ෂමතාව සහ කෘෂිකාර්මික අපනයනවල සැලකිය යුතු පහත වැටීමකට මෙන්ම ආහාර සඳහා ආනයන මත යැපීම වැඩි කිරීමට ද හේතු විය. මෙම තත්වයන් ආර්ථික අර්බුදය අතරතුර ආහාර අනාරක්ෂිතභාවය ඇති කිරීමට සහ මන්දපෝෂණය වැඩි කිරීමට හේතු විය. 2022 දී, විදේශ ණය සඳහා පොලිය ගෙවීම හෝ තම ජනතාව පෝෂණය කිරීම සඳහා ආහාර ආනයනය කිරීම යන තීරණාත්මක තේරීමකට ශ්‍රී ලංකාවට මුහුණ දීමට සිදු විය.

ආහාර සුරක්ෂිතතාව මනිනු ලබන්නේ ආහාර ලබා ගැනීමේ හැකියාව, දැරිය හැකි මිල, ගුණාත්මකභාවය, ආරක්ෂාව සහ තිරසාරභාවය යන කොන්දේසි මත බව අප සැලකිල්ලට ගත යුතුය. මෙම සියලු ක්ෂේත්‍රවලින්, 2022 ගෝලීය ආහාර සුරක්ෂිතතා දර්ශකයට අනුව ශ්‍රී ලංකාව දුර්වල ස්ථානයක (රටවල් 113 අතර 79 වන ස්ථානය) සිටින අතර, එයින් පෙන්නුම් කරන්නේ ආහාර සුරක්ෂිතතාව අතින් රට අවදානමකට ලක්ව ඇති බවයි. නවීන ගොවිතැන් ක්‍රම හරහා අපනයන විභවය උපරිම කරන සහ ප්‍රමාණවත් දේශීය නිෂ්පාදනයන් තුළින් ආහාර සුරක්ෂිතතාව තහවුරු කරන කාර්යක්ෂම කෘෂිකාර්මික අංශයක් සහතික කිරීම ඥානාන්විත වනු ඇත. තවද, ඉඩම් භාවිතය සහ බෝග මිශ්‍රණය පිළිබඳ පුළුල් සමාලෝචනයක් කිරීම යෝග්‍ය වනු ඇත.

## 4.3.3 නිමැයුම් කර්මාන්තය

මධ්‍ය කාලීනව ඉහළ මට්ටම් කරා ආර්ථික වර්ධනය වේගවත් කිරීමටත්, දිගුකාලීනව එය පවත්වා ගැනීම සඳහාත් හිතකර පරිසරයක් තුළ නිෂ්පාදනය වැඩි කිරීම ඉතා වැදගත් වන අතර, අවසානයේ එය රට ඉහළ ආදායම් ලබන තත්ත්වයකට පරිවර්තනය කරයි. හිතකර පරිසරයක් මඟින් ගෝලීය ආර්ථිකය සමඟ ඒකාබද්ධ වීම ඇතුළත් වන අතර, 'නිකේතන වෙළඳපොළ' ගැටළුව විසඳයි. එවැනි ඒකාබද්ධ කිරීම් මඟින් කර්මාන්තවල පරිමාණ පුළුල් කිරීමට සහ ප්‍රාග්ධනය සම්පාදනය කිරීමට හැකියාව ලැබේ. ඊට අමතරව, එය ජාත්‍යන්තර වෙළඳපොළ සහ ගෝලීය සැපයුම් දාම ඉලක්ක කරගත් විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කරයි. සත්කාරක රට සඳහා ප්‍රතිලාභ වැඩි දියුණු කරමින් විදේශීය සෘජු ආයෝජන ප්‍රාග්ධනය පමණක් නොව තාක්ෂණය, කළමනාකරණ විශේෂඥතාව, වෘත්තීයභාවය සහ ආදාන සහ ප්‍රතිදාන වෙළඳපල වෙත ප්‍රවේශය ද ගෙන එයි. (ඉහළ අගයක් එකතු කළ රෙදිපිළි සහ ඇඟලුම්, ආහාර සැකසීම සහ නිකේතන නිෂ්පාදනය [මෝටර් රථ අමතර කොටස්, බෝට්ටු තැනීම සහ ඉලෙක්ට්‍රොනික සංරචක] ගෝලීය වටිනාකම් දාමයන්ට සම්බන්ද වීමට උදාහරණ වේ).

නිමැවුම් කර්මාන්තය, දේශීය කෘෂිකර්මාන්තයෙන් අතිරික්ත ශ්‍රමය සංක්‍රමණය කිරීමට පහසුකම් සපයන අතරම, කෘෂිකාර්මික අංශයේ නවෝත්පාදන හා ඵලදායිතා වර්ධනය වැඩි දියුණු කරයි. තවද, එය සේවා අංශයේ වර්ධනය ශක්තිමත් කරන අතර නිෂ්පාදන ක්‍රියාවලියේදී අගය එකතු කිරීම් ජනනය කරයි. එමෙන්ම ආර්ථික වර්ධනයේ, අලෙවි කළ නොහැකි ක්ෂේත්‍රයන්ට ඇති නැඹුරුව වළක්වයි.

නිෂ්පාදනයට ඵලදායී ලෙස සහාය වීම සඳහා ප්‍රතිපත්ති සහ ප්‍රතිසංස්කරණ, බාධක ඉවත් කිරීම මෙන්ම තරඟකාරිත්වය වැඩි දියුණු කිරීම කෙරෙහි ද අවධානය යොමු කළ යුතුය. මේ සඳහා වන ප්‍රධාන ක්‍රියාමාර්ගවලට ඇතුළත් වන්නේ:

- ව්‍යාපාර මෙහෙයුම් සඳහා වඩාත් හිතකර පරිසරයක් නිර්මාණය කිරීම වෙනුවෙන් රෙගුලාසි, ආයතන සහ ක්‍රියා පටිපාටි සරල කිරීම සහ තාර්කික කිරීම.
- කර්මාන්තවල අඛණ්ඩ කාර්මිකකරණ ක්‍රියාවලිය සහ ජාත්‍යන්තර තරඟකාරීත්වය පවත්වා ගැනීම සඳහා ප්‍රාථමික සහ ද්විතීයික යන දෙඅංශයේම යෙදවුම් ලබා ගැනීමේ හැකියාව, දැරිය හැකි මිල සහ ගුණාත්මකභාවය සහතික කිරීම.
- ඩිජිටල්කරණය කරන ලද ක්‍රියාවලීන් අනුගමනය කරන අතර රටවල් අතර සම්බන්ධ ප්‍රතිපත්ති සහ රෙගුලාසි ප්‍රතිසංස්කරණය කිරීම.
- වෙළඳාම සහ ආයෝජන ප්‍රවාහයන් විධිමත් කිරීම සඳහා “තනි කවුළුවක්” සහිත පද්ධතියක් ස්ථාපිත කිරීම.
- තිරසාරභාවය සහතික කරමින් 21 වන සියවසේ අවශ්‍යතා සමඟ කාර්මිකකරණය පෙළගැස්වීම. ඒ සඳහා අවශ්‍ය ප්‍රමිතීන් සහ උසස් ඩිජිටල් ක්‍රියාවලීන් ඇතිකිරීම.
- වඩාත් සාධාරණ වර්ධනයක් ඇති කිරීම සහ උපාය මාර්ගික කර්මාන්ත සඳහා සහය වීම වෙනුවෙන් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය, ප්‍රාදේශීය කාර්මිකකරණය සහ ඉලක්කගත කර්මාන්ත වැනි ප්‍රමුඛ ක්ෂේත්‍රවල රජයේ කාර්යභාරය පුළුල් කිරීම.

## 4.3.4 ඩිජිටල් ආර්ථිකය

ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකය වේගයෙන් වර්ධනය වෙමින් පවතින අතර 2030 වන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් 12% ක දායකත්වයක් ලබා දීමට හැකියාවක් ඇති බව පෙන්නුම් කරයි. 2025 වර්ෂය සඳහා රජයේ අයවැය කතාවෙන් පෙන්නුම් කරන පරිදි, මෙම අංශයේ පරිවර්තනීය හැකියාව රජය විසින් හඳුනාගෙන ඇත. ඒ අනුව වර්තමානය වන විට අවධානය යොමු වී ඇත්තේ ඩිජිටල් පොදු යටිතල පහසුකම් සැපයීම, ඊ-රාජ්‍ය සේවා ව්‍යාප්ත කිරීම, (උදා: බදු එකතු කිරීම සහ රේගු ආදායම් එකතු කිරීම ඩිජිටල්කරණය කිරීම) නවෝත්පාදන ඇති කිරීම සඳහා අවශ්‍ය නීති රීති සකස් කිරීම සහ ආර්ථිකය පුරා ඩිජිටල් තාක්ෂණය හ ඩිජිටල් ගෙවීම් පද්ධති[4] ඇති කිරීම වෙතයි. ඩිජිටල් දැනුවත්භාවය සහ කුසලතා වැඩි කිරීම සහ වඩා හොඳ සයිබර් ආරක්ෂණ පද්ධති[5] ඇති කිරීම, ඩිජිටල් ආර්ථික සංවර්ධනයේ අනෙකුත් වැදගත් අංග වේ.

4 ඩිජිටල් ගෙවීම් සඳහා සමබිමක් නිර්මාණය කිරීම වෙනුවෙන් වඩා හොඳ වෙළඳ වට්ටම් අනුපාත සාකච්ඡා කිරීම අවශ්‍යයි. ඒ සඳහා රජය, බැංකු සහ ගෙවීම් සේවා සපයන්නන් සමඟ එක්ව කටයුතු කළ යුතුය. වර්තමානයේ, ශ්‍රී ලංකාව තුළ භාණ්ඩ හා සේවා පිරිවැයෙන් 2.5% සිට 3% දක්වා ඉහළ වෙළඳ වට්ටම් අනුපාත ඇති බවට ප්‍රසිද්ධය. මෙයින් අදහස් කරන්නේ මුදල් ගෙවීම් හා සසඳන විට ඩිජිටල් ගනුදෙනු සාපේක්ෂව මිල අධික බවයි.

5 කෘත්‍රිම බුද්ධිය වැනි නව තාක්ෂණයන්හි ව්‍යාප්තිය සහ රාජ්‍ය හා රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්ගේ සයිබර් ප්‍රහාර ඉහළ යමින් පවතින අවධියක මෙය විශේෂයෙන් වැදගත් වේ.

## 4.4 දරිද්‍රතාව අඩු කිරීම සඳහා ඇති ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීම

ශ්‍රී ලංකාවේ ඇති බ්‍රිතාන්‍ය ආකෘතියේ සුභසාධන ක්‍රමය මඟින් රජයේ රෝහල් පද්ධතියක් හරහා නොමිලේ විශ්වීය සෞඛ්‍ය සේවාවක් සහ රාජ්‍ය පාසල් සහ විශ්ව විද්‍යාල හරහා විශ්වීය අධ්‍යාපනයක් ලබා දේ. එමෙන්ම 'ජනසවිය' සහ 'සමෘද්ධි' වැඩසටහන් ඇතුළු විවිධ ආදායම් හුවමාරු වැඩසටහන් ද ශ්‍රී ලංකාවේ පැවතුණි.

නව මුදල් සහනාධාර වැඩසටහනක් වන 'අස්වැසුම', 2023 සිට ක්‍රියාත්මක වන අතර ලෝක බැංකු සහාය ඇතිව වැඩිදියුණු කරනු ලැබේ. මීට පෙර පැවති මුදල් හුවමාරු වැඩසටහන්වල ආවේණික දුර්වලතා විසඳීම මගින් පශ්චාත් අර්බුදකාරී දරිද්‍රතාව අවම කිරීම එහි අරමුණයි. මෙම වැඩිදියුණු කළ, ඉලක්කගත සහ කාලානුරූපී මුදල් හුවමාරු වැඩසටහන බැංකු හරහා කෙරෙන ඩිජිටල් පද්ධතියක් මගින් ක්‍රියාත්මක වේ. එය දැනට මිලියන 2 ක ජනතාවකට ප්‍රතිලාභ ලබා දෙන අතර, පශ්චාත් අර්බුදකාරී සමයේ ඇස්තමේන්තු කර ඇති පුද්ගලයින් මිලියන 7 සිට 10 දක්වා වන සමස්ත දරිද්‍රතා මට්ටම හා සසඳන විට එහි ප්‍රවේශය සීමිත බව පෙනේ.

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය විසින් මෑතකදී කරන ලද සමීක්ෂණවලින් පෙනී යන්නේ 'අස්වැසුම' වැඩසටහනේ බැහැර කිරීමේ සහ ඇතුළත් කිරීමේ දෝෂවලට පිළියම් යෙදීමෙන් සහ ඉලක්කගත දුර්වලතා අවම කිරීමෙන් තවදුරටත් ඵලදායී කළ හැකි බවයි (CEPA ඉදිරිය). ආර්ථිකයේ ඉක්මන් පිබිදීමක් සහ වේගවත් ප්‍රකෘතිමත් වීමක් තිබියදීත්, සමාජ වියදම් අපේක්ෂා කළ මට්ටමට වඩා අඩුවෙන් පවතින බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලද සඳහන් කරයි (IMF, 2025).

ආර්ථික අර්බුදයක ආරම්භයේ දී ඉලක්කගත ප්‍රජාවන්ට මුදල් හුවමාරු කිරීම් සහ අවශ්‍ය අවස්ථාවලදී මූලික ආහාර සහ ඉන්ධන සලාකනය කිරීම හඳුන්වා දිය යුතුය. සුදුසුකම්ලාභීන් විශේෂ හැඳුනුම්පත් ක්‍රමයක් හරහා තීරණය කළ යුතු අතර අකාර්යක්ෂමතාවන් තුරන් කිරීම සඳහා ප්‍රතිලාභ සෘජුවම ප්‍රතිලාභීන්ගේ බැංකු ගිණුම් වෙත මාරු කළ යුතුය. ලෝක බැංකුව දැනට ශ්‍රී ලංකාව සමඟ (ඉන්දියාවේ ආධාර් ක්‍රමය මෙන්) වඩා කාර්යක්ෂම නව මුදල් හුවමාරු පද්ධතියක් ('අස්වැසුම' සමාජ සුභසාධන ප්‍රතිලාභ වැඩසටහන) පිහිටු වීම සදහා කටයුතු කරමින් සිටින අතර, දරිද්‍රතාවයෙන් පෙළෙන්නන් වඩා හොඳින් ඉලක්ක කිරීම, නිසි හිමිකාරිත්වයක් නොමැති පුද්ගලයින්ට ලැබීම අඩු කිරීම සහ දිළිඳු ජනතාව සඳහා බැංකු ගිණුම් ආරම්භ කිරීම පුළුල් කිරීම වෙනුවෙන් සුවිශේෂී හැඳුනුම්පතක් ඇතිකිරීමට ද අපේක්ෂිතයි.

ආර්ථික අර්බුදයකදී ඇතිවන  දරිද්‍රතාව තේරුම් ගැනීම සඳහා සුවිශේෂී ප්‍රවේශයක් අවශ්‍ය වේ. මන්ද, එය සාමාන්‍ය තත්වයන් යටතේ දරිද්‍රතාවට වඩා සැලකිය යුතු ලෙස වෙනස් වන නිසාය. ශ්‍රී ලංකාවේ, අර්බුදයට පෙර දරිද්‍රතාව ප්‍රධාන වශයෙන් "සංවර්ධන ගැටලුවක්" වූ අතර, එය ප්‍රධාන ධාරාවේ සංවර්ධන ක්‍රියාවලියෙන් පුද්ගලයින් බැහැර කිරීමෙන් පැන නැගී තිබිණි. ඊට වෙනස්ව, ආර්ථික අර්බුදයක දී ඇතිවන දරිද්‍රතාව යනු ණය ගෙවීම් පැහැර හැරීම, උද්ධමනය, පොලී අනුපාත ඉහළ යාම සහ මුදල් ක්ෂයවීම් නිසා ඇතිවන ආර්ථික අස්ථාවරත්වයත් ආර්ථික හැකිලීම වැනි සාධකත් මගින් උද්දීපනය වන "සාර්ව ආර්ථික ගැටලුවක්" වන අතර, එමඟින් ව්‍යාපාර වසා දැමීම්, රැකියා අහිමිවීම්, ජීවනෝපායන් සහ ආදායම් පහත වැටීම් ඇතිවේ.

ඊට අමතරව, අර්බුදයට දක්වන ක්ෂණික ප්‍රතිපත්තිමය ප්‍රතිචාරය ද නොදැනුවත්වම දරිද්‍රතා මට්ටම් උග්‍ර කරන අතර, දරිද්‍රතාවයේ බලපෑම අවම කිරීමේ උත්සාහයන් තවදුරටත් සංකීර්ණ කරයි. මෙම දරිද්‍රතා තත්ත්වයන්ගේ වෙනස අවධාරණය කරන්නේ පශ්චාත් අර්බුද දරිද්‍රතාව සමාජ ආරක්ෂණ පියවරයන් මගින් පමණක් එලදායී ලෙස විසඳීමට නොහැකි බවයි. මන්ද, මේවා තාවකාලික සහනයක් පමණක් ලබා දෙන බැවිනි. ඒ වෙනුවට, ඉහළ වර්ධන ගම්‍යතාවයක් සාක්ෂාත් කර ගැනීම සහ පවත්වා ගැනීම කෙරෙහි අවධානය යොමු විය යුතුය. රැකියා උත්පාදනය සහ ආදායම් උත්පාදනය වැඩි කිරීමෙන්, එවැනි වර්ධනයක් ළඟා කරගැනීමටත්, දිගුකාලීන ආර්ථික නඟා සිටුවීමක් ඇති කිරීමට සහ අර්බුද මගින් මෙහෙයවනු ලබන දරිද්‍රතාව තුරන් කිරීමටත් එවැනි වර්ධනයක් මූලික පදනම වේ.

# 5. ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා වැදගත් වන පාඩම්

සමහර ආර්ථික ප්‍රතිපත්තිවල වැදගත්කම අපි යම් කාලයක් තිස්සේ දැන සිටියෙමු. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ සංවර්ධන ඉතිහාසය ආර්ථික ප්‍රතිපත්ති අර්ධ වශයෙන් සහ නොගැලපෙන අයුරින් ක්‍රියාත්මක කිරීමේ උදාහරණවලින් පිරී ඇති අතර මෙය ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන කාර්යසාධනය සීමා කර ඇත. මෙම කොටසේදී අපි 6 වෙනි ප්‍රතිපත්ති ක්ෂේත්‍රය වන 1 සිට 5 දක්වා වන ආර්ථික වර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන ආකාරය විමසා බලමු. එනම් දේශපාලන සම්මුතිය සහ රාජ්‍ය ධාරිතාව ගොඩනඟන්නේ කෙසේද යන්නයි.

පූර්ණ හා ඵලදායී ලෙස ප්‍රතිපත්ති ක්‍රියාත්මක නොවීමට බොහෝ දුරට හේතු වී ඇත්තේ:

(1) ආර්ථික ප්‍රතිපත්තියේ දිශාව පිළිබඳ දේශපාලන ඒකඟතාවයක් නොමැතිකම
(2) දුර්වල රාජ්‍ය ධාරිතාව සහ දේශපාලන දිරිගැන්වීම්
(3) ව්‍යාපෘති අධීක්ෂණයක් නොමැතිකම

## 5.1 දේශපාලනික ඒකඟතාවයක් නොමැතිකම

දේශපාලනික ආර්ථික දෘෂ්ටිකෝණයකින් පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික අර්බුදයට මූලික හේතුව වන්නේ පැහැදිලි හා ස්ථාවර සංවර්ධන උපාය මාර්ගයක් පිළිබඳ දේශපාලනික ඒකඟතාවයක් නොමැතිවීමයි. 1960 ගණන්වල සිට ආර්ථික අස්ථාවරත්වය සහ අවිනිශ්චිතතාවය ඇති කළ නිරන්තර ප්‍රතිපත්ති වෙනස් කිරීමේ විෂම චක්‍රයක් පැවතුනි. ශ්‍රී ලංකාව 1960 සහ 1970 කාල වල අභ්‍යන්තරික ආනයන ආදේශන ප්‍රතිපත්ති අනුගමනය කළේය. මෙය සමහර විට ආවේණික අවශ්‍යතා මගින් ඇතිකරන ලද ප්‍රතිසංස්කරණ පිළිබඳ දේශපාලනික ඒකඟතාවයක් නොමැතිකම නිසා ඇතිවූවක් විය හැකිය. '1956 විප්ලවයෙන්' පසුව ඇතිවූ තත්වය හේතුවෙන් රට තුළ අභ්‍යන්තරික ජාතිකවාදී ප්‍රතිපත්තිවලට

ප්‍රමුඛත්වය දීමේ නැඹුරුවක් ඇතිවිය. එය අඩු ආයෝජන, අඩු ආර්ථික වර්ධනය සහ ඉහළ විරැකියාවෙන් සමන්විත ආර්ථිකයක් ඇති කිරීමට හේතු විය. නැගෙනහිර සහ අග්නිදිග ආසියාවේ අපනයනය ප්‍රමුඛකරගත් අසල්වැසි රටවල් අත්පත්කරගත් ආර්ථික සාර්ථකත්වය ළඟාකර ගැනීමට ශ්‍රී ලංකාවට නොහැකි විය.

1977 වන විට රට ආර්ථික ප්‍රතිසංස්කරණ සඳහා යොමුවීම අත්‍යවශ්‍ය වී තිබුණි. 1977 පාර්ලිමේන්තු මැතිවරණයේ ප්‍රතිඵලයක් ලෙස එක්සත් ජාතික පක්ෂ රජයක් බිහි වූ අතර ජාත්‍යන්තර වෙළඳාම සහ වෙළඳපොළ කෙරෙහි වඩාත් නැඹුරු වූ ආර්ථිකයක් සඳහා පුළුල් ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ඇතිකිරීමට කැපවී සිටියේය. මෙම ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණයන් සඳහා වෙළඳ ප්‍රතිපත්ති ලිහිල්කරණය, මූල්‍ය ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය, මිල පාලනයන් ඉවත් කිරීම, මූල්‍ය ලිබරල්කරණය, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය සහ කාර්මික ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ඇතුළත් විය. 1977 දී හඳුන්වා දුන් ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ මගින් වඩාත් සුදුසු දිරිගැන්වීම් නිර්මාණය කිරීම සහ පෞද්ගලික අංශයේ සංවර්ධනය සඳහා නෛතික රාමුව ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. එහි අරමුණ වූයේ දේශීය වෙළඳපොළ සඳහා පමණක් කළ නිෂ්පාදනය කිරීම වෙනස්කර අපනයනය සඳහා වැඩි අවධානයක් යොමු කිරීමයි. කෙසේ වෙතත්, නිෂ්පාදනයේ (උදා: රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ සහ දේශීය තරඟකාරිත්වයට ප්‍රතිසංස්කරණ) සහ සාධක වෙළඳපොළවල්හි (උදා: ඉඩම්, ශ්‍රමය සහ ප්‍රාග්ධනය) ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ඇති කිරීමට දේශපාලන කැමැත්තක් නොමැතිකම හේතුවෙන් ප්‍රතිසංස්කරණ සඳහා වූ ගම්‍යතාව ඉක්මනින් ඇණහිටුණි. දශක ගණනාවක් තිස්සේ රටේ වෙළඳ හා වර්ධන උපායමාර්ගයන්හි දිශානතිය පිළිබඳ එකඟතාවයක් නොමැතිකම ද වත්මන් ආර්ථික අර්බුදයට දායක වී තිබේ. ජාතික ආර්ථික සංවර්ධනය සඳහා වසර 5ක නව දැක්මක් පිළිබඳ එකඟතාවකට දේශපාලන පක්ෂ, ව්‍යාපාරික සංවිධාන, වෘත්තීය සමිති සහ සිවිල් සමාජය එළැඹිය යුතුය (කුමාරස්වාමි සහ විග්නරාජා, 2023). අධ්‍යයන කණ්ඩායම් සහ මාධ්‍ය විසින්, අවිනිශ්චිත ගෝලීය ආර්ථිකයක් තුළ අභ්‍යන්තරයට නැඹුරු සහ බාහිරට නැඹුරු ප්‍රතිපත්තිවල වාසි හෝ අවාසි පිළිබඳ මෙන්ම විශ්වසනීය ආර්ථික මූලාශ්‍ර පිළිබඳව හරවත් සංවාද සංවිධානය කිරීමට සම සත්කාරකත්වය දැක්වීම වැදගත්ය.

එවැනි සංවාදයන් තුළදී එකඟවූ ක්ෂේත්‍ර පිළිබඳව ඉදිරි දශකය සඳහා ජාතික සංවර්ධන දැක්මක් පිළියෙළ කොට ලේඛණයක් ලෙස එළිදැක්වීමද වටිනා කාර්යයකි. එවැනි ලේඛණයක පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතුය.

- ආර්ථික සංවර්ධන ජයග්‍රහණ සහ අසාර්ථකත්වයන්
- ආයෝජන සහ ඵලදායිතාව වෙනස් කිරීම ඇතුළුව ආර්ථික සංවර්ධනය සඳහා යථාර්ථවාදී ඉලක්ක
- බාහිර-නැඹුරු, වෙළඳපොළ-හිතකාමී ප්‍රතිපත්ති සඳහා න්‍යාය පත්‍රයක්
- ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට ඇති අවදානම්

ආර්ථික සංවර්ධනය සඳහා වන ජාතික දැක්ම පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම සඳහා, රට පුරා ප්‍රජා සම්බන්ධතා ක්‍රියාකාරකම් පැවැත්විය යුතුය. දකුණු කොරියාව, මැලේසියාව, සිංගප්පූරුව, තායිලන්තය, වියට්නාමය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ ඉන්දියාවේ සාර්ථකත්වයන්, ආර්ථික සංවර්ධනය සඳහා එවැනි ජාතික දැක්මක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රායෝගික වැදගත්කම ඉස්මතු කරයි.

## 5.2 දුර්වල රාජ්‍ය ධාරිතාව

අප රට තුළ තීරණාත්මක ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට හා මනා අධීක්ෂණයක් පවත්වාගෙන යාමට අවශ්‍ය ව්‍යවස්ථාදායක සහ තාක්ෂණික ධාරිතාව ප්‍රමාණවත් ලෙස ඇත් දැයි  හැගේ?[6] තවද, රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ දී සාමාන්‍යයෙන් විවිධ විෂය ධාරාවල උපාධිධාරීන් ඇතුළත් වන අතර ඔවුන් පුහුණුව ලබන ප්‍රධාන ක්‍රමය වන්නේ රැකියාව තුළදීම වීමද රාජ්‍ය ධාරිතාව දුර්වල වීමට බලපායි. ශ්‍රී ලංකා මහ බැංකුව, සිය වෘත්තිකයන්ට විදේශීය විශ්ව විද්‍යාලවල ආර්ථික විද්‍යාව සහ ඒ ආශ්‍රිත විෂයයන් පිළිබඳ උපාධි අධ්‍යයනයන් සහ කෙටි කාලීන පුහුණුව හරහා අඛණ්ඩ ඉගෙනුම් අවස්ථා ලබාදීම වැදගත් පියවරකි. එය ආයතනයේ තාක්ෂණික ධාරිතාව වැඩිදියුණු වී වෘත්තීය දියුණුවට ද සහාය වී ඇත. විදේශීය උපාධි අධ්‍යනය සඳහා අවස්ථා ලබාදීමේ මෙම පිළිවෙත වෙනත් බොහෝ රාජ්‍ය ආයතනවල ක්‍රියාත්මක නොවේ. ඒ වෙනුවට විධිමත් පුහුණුව සඳහා රාජ්‍ය ආයතන මතම (අවශ්‍ය මුදල් හා අධ්‍යන අංශ හිඟ) හෝ පරිත්‍යාගශීලීන්ගේ අරමුදල් වලින් ක්‍රියාත්මක තාවකාලික කෙටි පාඨමාලා මත දැඩි ලෙස රඳා පවතින්නට සිදුවී ඇත.

විශේෂයෙන් රජය, රාජ්‍ය අංශයේ සේවා විධිමත්ව සැපයීමට ප්‍රමුඛත්වය දිය යුතු අතර, රාජ්‍ය අංශය තුළ කුසලතා පූර්ණ පිරිස් රඳවා ගැනීම සඳහා යහපාලනය සහ රාජ්‍ය පරිපාලනය පිළිබඳ විශේෂඥතාව වර්ධනය වෙනුවෙන් ප්‍රතිපත්ති නිර්මාණය කළ යුතුය. වෙළඳපොළ නැඹුරු රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය සේවා ඩිජිටල්කරණය, නීති සම්පාදකයින් පුහුණු කිරීම සහ ආර්ථික ප්‍රතිසංස්කරණවල සංකීර්ණතා අවබෝධ කර ගැනීම යන කරුණු සඳහා වැඩිදියුණු කළ සැලසුම් සකස් කිරීම ද ඉතා වැදගත් වේ. නීති සම්පාදකයින්ගේ සහ ජ්‍යෙෂ්ඨ පරිපාලකයින්ගේ ධාරිතා වර්ධනය කිරීමට අති නවීන රාජ්‍ය ප්‍රතිපත්ති පුහුණු ආයතනයක් ස්ථාපිත කිරීම, ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ජාලයට වටිනා එකතු කිරීමක් වනු ඇත.

---

6 ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රතිපත්ති කළමනාකරණය සඳහා රාජ්‍ය ධාරිතාවයේ ඵලදායීතාවය පිළිබඳ අධ්‍යයනයන් පවතින්නේ ඉතා ස්වල්පයක් වීමයි. මුල් අධ්‍යයනයකට ඇතුළත වන්නේ: වනසිංහ සහ ගුණරත්න (1996).

## 5.3 සීමිත ව්‍යාපෘති අධීක්ෂණය

ප්‍රසම්පාදන ප්‍රමාදයන්, සුදානමක් නොමැතිකම, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ඇති සුදානම මද වීම, කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල ක්‍රියාකාරීත්වය, තෙවන පාර්ශවීය නිෂ්කාශන ලබා ගැනීමේ ප්‍රමාදයන්, ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැතිවීම, ණය ගෙවීම් අත්හිටුවීම සහ දුර්වල ව්‍යාපෘති කළමනාකරණය වැනි විවිධ හේතූන් මත ශ්‍රී ලංකාවේ සංවර්ධන ව්‍යාපෘති බොහොමයක් තම අපේක්ෂිත ප්‍රතිලාභ කාලෝචිත ලෙස මහජනතාවට ලබා දීමට අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය වේ. සංවර්ධන ව්‍යාපෘති ඵලදායී ලෙස ක්‍රියාත්මකවීමට නම් ඒ සදහා අවශ්‍ය පියවරයන් ගැනීම පිළිබඳව රජයේ ඉහල මට්ටමෙන්ම සොයා බැලිය යුතුය. මෙම ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාමේ හැකියාව ඇත්තේ ශක්තිමත් නායකයෙකුට හෝ දේශපලන වශයෙන් පරිණත අයෙකුටය. තවද, ඉහළ මට්ටමේ නිලධාරීන් සහ විවිධ පාර්ශ්වකරුවන් අතර සහයෝගීතාවය ද අත්‍යවශ්‍ය වේ.

රජයේ ව්‍යාපෘති සළඳහා ව්‍යාපෘති අධීක්ෂණය ඉතා වැදගත් වන්නේ එය වගවීම, විනිවිදභාවය සහ කාර්යක්ෂම සම්පත් වෙන් කිරීම සහතික කරන බැවිනි. එමෙන්ම ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට, අධීක්ෂණ රාමුවක් ඇති කිරීම මඟින් ගැටළු හඳුනා ගැනීම සහ දැනුවත් තීරණ ගැනීම පහසු වන අතර, අවසානයේ වඩා හොඳ ව්‍යාපෘති ප්‍රතිඵල තහවුරු කෙරෙන අතරම මහජන විශ්වාසය ද වැඩි වේ.

ව්‍යාපෘති ක්‍රියාත්මක වීමේ සාර්ථකත්වය ඇගයීම සදහා, බොහෝ ව්‍යාපෘති කළමණාකරණ පද්ධති වල විවිධ ක්‍රියාවලීන් අන්තර්ගත වේ. ව්‍යාපෘති කළමනාකරණ පද්ධතියට අදාළ ක්‍රියාවලිය පුළුල් ලෙස ප්‍රධාන කාණ්ඩ පහකට බෙදිය හැකිය. එනම්, මුලපිරීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා පාලනය කිරීම සහ වසා දැමීම. සෑම කාණ්ඩයකටම වෙනම ක්‍රියාවලීන් කිහිපයක් ඇතුළත් වේ. තවද ව්‍යාපෘති අදියරයන් පිළිබඳ තොරතුරු යාවත්කාලීන කිරීම හෝ එකතු කිරීම බොහෝ විට අවශ්‍ය වේ. ව්‍යාපෘති කළමනාකරණය අඛණ්ඩ ක්‍රියාවලියක් වන අතර, කලින් සිදු කරන ලද කාර්යන් සහ ඉදිරි සැලසුම් සුදුසු අයුරින් වෙනස් කිරීමද අවශ්‍ය වේ.

එපමණක් නොව ව්‍යාපෘති විෂය පථ කළමනාකරණයට, ව්‍යාපෘති නිර්මාණයට සහ එය සාර්ථකව නිම කිරීමට අවශ්‍ය ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සහ ඇතුළත් කිරීම සහතික කරන ක්‍රියාමාර්ග ද ඇතුළත් වේ.

## 5.4 ඵලදායී ලෙස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රධාන ක්‍රියාමාර්ග

මෙම කොටසේදී ES1 වගුවේ යෝජනා කර ඇති ප්‍රතිසංස්කරණ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට සහය වන නවීන ආයතනික ක්‍රමවේදයන් සාකච්ඡා කෙරේ.

- ප්‍රතිපත්ති සම්පාදනයේ අනුකූලතාව සහ පුරෝකථන හැකියාව වැඩිදියුණු කිරීමට මෙන්ම, ප්‍රමුඛතා සැකසීම සහ සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම සඳහා ජනාධිපති ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුත් සංවර්ධන කටයුතු ඇතුළත් අමාත්‍යාංශවල ලේකම්වරුන්ගේ කමිටුවක් ස්ථාපිත කිරීම.
- සියලුම ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති, අධීක්ෂණය කිරීම ට සහ කාලෝචිත ලෙස ක්‍රියාත්මක කිරීම සහ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සහතික කරගැනීම සඳහා ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්වරයෙකුගේ විෂය පථය යටතේ ජනාධිපති ලේකම් කාර්යාලයේ ජාතික මෙහෙයුම් කාර්යාලයක් හෝ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ සහ අධීක්ෂණ අංශයක් ස්ථාපිත කිරීම.
- ජාතික ආර්ථික ප්‍රමුඛතාවයන්ට අනුකූලව ව්‍යාපෘති හඳුනා ගැනීම සඳහා ශක්තිමත් ක්‍රියාවලියක් සකස් කිරීම. ජනතාවගේ අවශ්‍යතාවලට අනුකූලව ඉහළ ප්‍රමුඛතා ව්‍යාපෘති/මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති තෝරා ගැනීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, ව්‍යාපෘති කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම හා, ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතිවලට ප්‍රමුඛත්වය දීම සහ අධීක්ෂණය කිරීම සදහා ගරු අග්‍රාමාත්‍යවරයා හෝ ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරයෙකුගේ සභාපතිත්වයෙන් යුත් ඉහළ මට්ටමේ කමිටුවක් පත් කිරීම. මෙම ව්‍යාපෘති විය හැක්කේ:
    - විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ව්‍යාපෘති.

- කැබිනට් අමාත්‍යාංශ මගින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති.
- පළාත් සභා මගින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති.
- විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති.

මෙම කමිටුවේ ලේකම් සහ කැඳවුම්කරු ලෙස ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්වරයෙකු කටයුතු කල හැකිය.

- ප්‍රමුඛතාගත මහා පරිමාණ ව්‍යාපෘතිවල (රුපියල් මිලියන 1000 ට වැඩි) ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්වරයෙකුගේ සභාපතිත්වයෙන් යුක්ත "ව්‍යාපෘති අධීක්ෂණ කමිටුවක්" ස්ථාපිත කිරීම. එමඟින් කාලෝචිත ලෙස ක්‍රියාත්මක කිරීම සහ අපේක්ෂිත ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සහතික කල හැක. මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී කමිටුවට ඇතුළත් විය යුතු, අනෙකුත් සාමාජිකයින් වන්නේ:
    - අධ්‍යක්ෂ ජනරාල්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
    - අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව
    - අධ්‍යක්ෂ ජනරාල්, ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව
    - අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
    - අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

ජනාධිපතිවරයාගේ අතිරේක ලේකම්වරයෙකුට "ව්‍යාපෘති අධීක්ෂණ කමිටුවේ" ලේකම් සහ කැඳවුම්කරු ලෙස කටයුතු කළ හැකිය.

පෙර වසරවල උපායමාර්ගික වෙළඳ හා ආයෝජන කටයුතුවල නියැලී සිටි රාජ්‍ය නිලධාරීන්ට ආයතනික කටයුතු පිළිබඳ පළපුරුද්ද, තාක්ෂණික විශේෂඥතාව සහ ප්‍රායෝගික අවබෝධය ඇති බැවින්, ඔවුන් සිවිල් සේවය පුරාවටම බඳවා ගත යුතුය (ස්මාර්ට් අනාගතයක් සඳහා වූ මධ්‍යස්ථානයේ ප්‍රතිපත්ති සටහන 2025 අප්‍රේල් 15).
රජය රට තුළ පවතින විශේෂඥතාවයන් ව්‍යාපෘති අධීක්ෂණය සඳහා භාවිතා කළ යුතු අතර ඒ සම්බන්ධ සංවාදය සහ උපදේශනය වෙනුවෙන් විනිවිද පෙනෙන ක්‍රියාවලියක් සහතික කළ යුතුය. උපදේශක කමිටු සහ විශේෂ ක්‍රියාකාරී කණ්ඩායම් පත් කරන විට, අදාළ ක්ෂේත්‍රවල සියලුම අංශ/පාර්ශවකරුවන් සැබවින්ම

නියෝජනය විය යුතුය. සියලුම කමිටු සහ ක්‍රියාකාරී කණ්ඩායම්වලට ඔවුන් විසින් සම්පූර්ණ කල යුතු කාර්යන්, එම කාර්යන් සම්පූර්ණ කිරීමට ගතහැකි කාලසීමාවන් සහිතව පැනවිය යුතුවේ. තවද එම කමිටු අදාල අධිකාරීන් වෙත එම කාර්යය වල ප්‍රගතිය කලින් කලට වාර්තා කල යුතුවේ. (ව්‍යාපෘති අධීක්ෂණය පිළිබඳ යහපත් භාවිතයන් වල වැඩි විස්තර සඳහා දෙවෙනි උපග්‍රන්ථය බලන්න)

# 6. පසු යෙදුම

වර්තමානය වන විට ශ්‍රී ලංකාව වැදගත් සන්ධිස්ථානයක සිටින අතර ලෝකයම එහි ක්‍රියාකාරීත්වය දෙස බලා සිටී. නව රජය පොරොන්දු සහගත ආරම්භයක් ලබා දී ඇත. ආර්ථිකය ආකර්ෂණීය ලෙස ස්ථාවර වෙමින් පවතී. IMF වැඩසටහන නිසි මගට පැමිණ ඇති අතර ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ සංකීර්ණ සාකච්ඡා සාර්ථකව අවසන් කර ඇත. සියල්ලටමත් වඩා, සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය සඳහා පැහැදිලි රාමු අන්තර්ගත නව නීති ඇතිවී තිබීම හිතකර තත්ත්වයකි. රාජ්‍ය මූල්‍ය නීති දැඩි කර ඇති අතර මුදල් ප්‍රතිපත්තියේ අයහපත් භාවිතයන් සඳහා වන මාර්ග ඉවත් කර ශ්‍රී ලංකා මහ බැංකුවට වැඩි ස්වාධීනත්වයක් ලබා දී ඇත. ඒ යටතේ, විනිමය අනුපාතය නම්‍යශීලීව කළමනාකරණය කරනු ඇත.

සාර්ව ආර්ථික ආතතිය හේතුවෙන් අඛණ්ඩව ඇතිවූ අයහපත් සිදුවීම් අතීතයට අයත් දෙයක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. අවශ්‍ය විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා ස්වෛරී ශ්‍රේණිගත කිරීම සහ ව්‍යාපාර කටයුතු පිළිබඳ විශ්වාසය වැඩි දියුණු කිරීමට පියවර ගැනීම අත්‍යවශ්‍ය වේ.

කෙසේ වෙතත්, මෙවන් අවිනිශ්චිත ගෝලීය ආර්ථික කාලවලදී සර්ව සහභාගීත්වයෙන් යුත් සහ පරිවර්තනීය වර්ධනයක් අත්කර ගැනීම සඳහා තවමත් ප්‍රබල අභියෝග තිබේ. ආර්ථිකය පරිවර්තනය කිරීමට, එහි නිෂ්පාදනය ශක්තිමත් කිරීමට සහ විවිධාංගීකරණය කිරීමටත් එමඟින් ඉදිරි වසර පහ තුළ වර්ධනය 3% සිට තිරසාර 5% දක්වා ඉහළ නැංවීමට ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සඳහාත් විශේෂිත ප්‍රවේශයක් අවශ්‍ය වේ. 5% ක ආර්ථික වර්ධනය 2027/28 වර්ෂ වලදී තව සහන කප්පාදුවක් සමඟ තවත් ණය ප්‍රතිව්‍යුහගත කිරීමක් වළක්වා ගැනීම සඳහා අවශ්‍ය අවම අගය බව අපි සිතමු, ශ්‍රී ලංකාව තුළ උග්‍ර ලෙස වැඩිවන දරිද්‍රතාවය සහ අවදානම සැලකිය යුතු අයුරින් ආපසු හැරවීම සඳහා ආර්ථික වර්ධනය වේගවත් කිරීම අවශ්‍ය වේ.

මේ සඳහා, ආර්ථික පරිවර්තන පනත (සංශෝධන සහිතව) ක්‍රියාත්මක කිරීම සඳහා අයවැය කතාව තුළ පෙන්වූ කැපවීම උපරිම වේගවත්භාවයෙන් ක්‍රියාත්මක කළ යුතුය. මෙම වාර්තාවේ ඉදිරිපත් කෙරෙන ආර්ථික  වර්ධන සැලැස්මක් සම්බන්ධ කරුණු මෙය ඵලදායී ලෙස සිදු කිරීම සඳහා මඟපෙන්වනු ලබයි. එමෙන්ම, එවැනි සැලැස්මක් වඩා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සදහා රාජ්‍ය ධාරිතාවය ගොඩනැගීමේ අවශ්‍යතාවය ද මතු කරයි.

සාර්ථක ප්‍රතිඵල අත්පත් කරගැනීම සඳහා ප්‍රායෝගික නායකත්වය, නිර්භීත ප්‍රතිපත්ති තීරණ ගැනීම, අනාගත සමෘද්ධිය සඳහා පැහැදිලි දැක්මක් සහ සංවර්ධන හවුල්කරුවන්ගේ සහයෝගය අවශ්‍ය වනු ඇත. එවැනි නායකත්වයකට පරිවර්තනීය ආර්ථික වර්ධනය සඳහා ඇති අවස්ථාවන් ග්‍රහණය කර ගැනීමට මෙන්ම තවත් සාර්ව ආර්ථික අර්බුදයක් ඇතිවීම වළක්වා ගැනීමටද ඇති අවස්ථාව මෙය වේ..

# යොමුව

**Abeyratne, S.** (2023) 'Economic crisis in Sri Lanka: the way-in and the way-out'. *Sri Lanka Economic Journal* 20: 1–16

**Abeyratne, S.** (2025) 'Tourism: perils of playing it by ear!' Sunday Times, 30 March (www.sundaytimes.lk/250330/business-times/tourism-perils-of-playing-it-by-ear-2-593418.html).

**Amarasekara, C. and Venuganan, P.** (2021) 'Comparative review of the human capital development journeys of Vietnam and Sri Lanka'. *Vietnam Journal for Indian and Asian Studies* 9(106): 14–27.

**Athukorala, P.** (2025) 'The Sri Lankan economy: from optimism to debt trap'. Working Paper 2025-1-3. Tokyo: Japan Center for Economic Research.

**Basu, K.** (2022) 'Why Sri Lanka imploded., Project Syndicate, 20 July (www.project-syndicate.org/commentary/sri-lanka-why-it-has-collapsed-by-kaushik-basu-2022-07).

**Breuer, P. and Woldemichael, M. T.** (2025) 'Sri Lanka's economic reform program is delivering—keep going for a full recovery'. IMF Op-Ed, 25 March (www.imf.org/en/News/Articles/2025/03/25/032525-breuer-and-woldemichael-oped-sri-lanka-economic-reform-program-is-delivering).

**CEPA – Centre for Poverty Analysis** (forthcoming) 'Crisis-driven poverty dynamics in Sri Lanka'. Colombo: CEPA.

**Coomaraswamy, I. and Wignaraja, G** (2023) 'What can we learn from Sri Lanka's debt default?' LSE Blog, 16 October (https://blogs.lse.ac.uk/southasia/2023/10/16/what-can-we-learn-from-sri-lankas-debt-default/).

**CSF – Centre for a Smart Future** (2025) 'Responding to global economic challenges: eight priority trade and competitiveness reforms for

Sri Lanka'. Policy Note, 15 April (www.csf-asia.org/wp-content/uploads/2025/04/CSF-Policy-Note_Eight-Priority-Trade-and-Competitiveness-Reforms-Sri-Lanka_15042025.pdf).

**Devarajan, S.** (2025), 'Accountability: the key to sustained and inclusive growth in Sri Lanka' in G. Wignaraja and D.W. te Velde (eds) *Sri Lanka: from debt default to transformative growth. Second edition.* London: ODI Global.

**East Asia Forum** (2023) 'In Sri Lanka, economic necessity collides with political reality'. East Asia Forum, 18 December (https://eastasiaforum.org/2023/12/18/in-sri-lanka-economic-necessity-collides-with-political-reality/).

**Fitch Ratings** (2025) 'Sri Lanka's revenue raising drive key to credit profile'. 19 February (www.fitchratings.com/research/sovereigns/sri-lankas-revenue-raising-drive-key-to-credit-profile-19-02-2025).

**Gunatilake, H.** (2024) 'Growth and poverty in Sri Lanka: updates on the nexus'. Daily Mirror, 5 June (www.dailymirror.lk/features/Growth-and-poverty-in-Sri-Lanka-Updates-on-nexus/185-284105).

**IMF – International Monetary Fund** (2025) 'IMF Executive Board completes the Third Review under the Extended Fund Facility Arrangement with Sri Lanka'. Press Release 25/053 (www.imf.org/en/News/Articles/2025/02/28/pr25053-sri-lanka-imf-completes-the-3rd-rev-under-the-eff).

**Isenman, P.** (1980) 'Basic needs: the case of Sri Lanka'. *World Development* 8: 237–258.

**Kaluarachchi, S., Jayathilaka, R. and Rehman, S.** (2024) 'Unveiling Sri Lanka's brain drain and labour market pressure: a study of macroeconomic factors on migration'. PLoS One 11: 19(3): e0300343 (https://pmc.ncbi.nlm.nih.gov/articles/PMC10927103/).

**Kelegama, S.** (2000) 'Development in independent Sri Lanka: what went wrong?' *Economic and Political Weekly* 35(17), 22–28 April.

**Kojima, K.** (2000) 'The "flying geese" model of Asian economic development: origin, theoretical extensions, and regional policy implications'. *Journal of Asian Economics* 11(4): 375–401.

**Macmillan, M. Page, J. Booth, D. and te Velde, D.W.** (2017) 'Supporting economic transformation: an approach paper'. London: ODI.

**Mendez-Parra, M., Ayele, J. and Wignaraja, G.** (2025) 'The impact of tariff removal in proposed FTAs for Sri Lanka' in G. Wignaraja and D.W. te Velde (eds) (2025) *Sri Lanka: from debt default to transformative growth*. London: ODI Global.

**Ministry of Finance, Economic Stabilisation and National Policies** (2024) 'Sri Lanka reaches debt restructuring agreements in principle with external creditors on approximately US$ 17.5 bn of sovereign debt'. Press Release, 19 September (www.treasury.gov.lk/api/file/16dc614c-d9a9-47ff-94d6-aab0811e62ba).

**NPP – National People's Power** (2024) 'A thriving nation – a beautiful life'. (www.npp.lk/up/policies/en/npppolicystatement.pdf).

**Parliament of Sri Lanka** (2025) 'Hon. President Anura Kumara Dissanayake presents the Budget 2025 to Parliament in his capacity as the Minister of Finance', 17 February (www.parliament.lk/news-en/view/4374).

**Smith, G.** (2025), 'The evolution of Sri Lanka's debt crisis: lessons for better borrowing' in G. Wignaraja and D.W. te Velde (eds) (2025) *Sri Lanka: from debt default to transformative growth*. London: ODI Global.

**Sri Lanka Bureau of Foreign Employment** (2024) 'The number of individuals who have gone abroad for employment exceeds 300,000' (www.slbfe.lk/slbfe-news/the-number-of-individuals-who-have-gone-abroad-for-employment-exceeds-300000/).

**Sri Lanka Tourism Development Authority** (2024) 'Weekly report (December 2024) weekly tourist arrivals' (www.sltda.gov.lk/storage/common_media/WeeklyReportDECEMBER-01-31.pdf).

**Takada, S.** (2025) 'Japan must remain vigilant as Trump 2.0 looms'. East Asia Forum, 11 January (https://eastasiaforum.org/2025/01/11/japan-must-remain-vigilant-as-trump-2-0-looms/).

**UNDP – United Nations Development Programme** (2023) 'Understanding multidimensional vulnerabilities: impact on people of Sri Lanka'. Developed with OPHI (www.undp.org/srilanka/mvi).

**Wanasinghe, S. and H. Gunaratna** (1996), 'Enhancing the effectiveness of public policy management: the challenge for Sri Lanka'. Research Studies Governance Series 3. Colombo: Institute of Policy Studies.

**Weerasinghe, P.N.** (2021) 'Sri Lanka's macro-financial developments: issues and challenges in structural transformation and lessons from China's Experience'. UNCTAD, June (https://unctad.org/system/files/official-document/BRI-Project_RP13_en.pdf).

**Weerasinghe, P.N., Amarasekera, C. and Jegajeevan, S.** (2025) 'Disinflating an economy in crisis: the case of Sri Lanka' in G. Wignaraja and D.W. te Velde (eds) *Sri Lanka: from debt default to transformative growth*. Second edition. London: ODI Global.

**Wignaraja, G.** (2024a) 'Sri Lanka's new outsider president in with a chance'. East Asia Forum, 2 October (https://eastasiaforum.org/2024/10/02/sri-lankas-new-outsider-president-in-with-a-chance/).

**Wignaraja, G.** (2024b) 'Sovereign default and economic crisis in Sri Lanka: causes and policy lessons'. Institute of South Asian Studies South Asia Scan, 30 April (www.isas.nus.edu.sg/papers/sovereign-default-and-economic-crisis-in-sri-lanka-causes-and-policy-lessons/).

**Wignaraja, G. and Kripalani, M.** (2024) 'How India and Sri Lanka can go from aid to trade'. Indian Express, 17 December (https://indianexpress.com/article/opinion/columns/india-sri-lanka-aid-trade-9729776/).

**Wignaraja, G. and te Velde, D.W.** (eds) (2025) *Sri Lanka: from debt default to transformative growth*. Second edition. London: ODI Global.

**World Bank Group** (2023) *Macro poverty outlook country-by-country analysis and projections for the developing world*. Washington, DC: World Bank Group.

**World Bank Group** (2025a) *Macro poverty outlook country-by-country analysis and projections for the developing world*. Washington, DC: World Bank Group.

**World Bank Group** (2025b) 'Staying on track', Sri Lanka Development Update, April (https://documents1.worldbank.org/curated/en/099416504222514112/pdf/IDU-5b9c001a-8831-43a2-92e7-71fbee0f642e.pdf).

# උපග්‍රන්ථය 1

භාණ්ඩ හා සේවා අපනයන, විදේශ සෘජු ආයෝජන ගලා ඒම් සහ සංචාරක ඉපැයීම්, රටවල් සංසන්දනය

| | ඇ.ඩො. මිලියන | | | | දළ දේශීය නිෂ්පාදිතයෙන් % | | | |
|---|---|---|---|---|---|---|---|---|
| භාණ්ඩ අපනයනය | 2018 | 2020 | 2023 | 2024 | 2018 | 2020 | 2023 | 2024 |
| ශ්‍රී ලංකාව | 11,890 | 10,047 | 11,911 | 12,772 | 12.6 | 11.9 | 14.1 | 12.9 |
| බංග්ලාදේශය | 39,252 | 33,605 | 44,237 | 47,245 | 12.2 | 9.0 | 10.1 | 10.5 |
| කාම්බෝජය | 12,700 | 17,716 | 23,470 | 26,661 | 38.3 | 50.9 | 55.4 | 56.3 |
| තායිලන්තය | 252,957 | 231,634 | 285,074 | 300,529 | 49.9 | 46.3 | 55.4 | 57.1 |
| වියට්නාමය | 243,699 | 282,629 | 353,782 | 403,241 | 78.6 | 81.5 | 82.3 | 87.8 |
| සේවා අපනයනය | 2018 | 2020 | 2023 | | 2018 | 2020 | 2023 | |
| ශ්‍රී ලංකාව | 2,002 | 3,035 | 5,416 | | 2.1 | 3.6 | 6.4 | |
| බංග්ලාදේශය | 2,197 | 6,020 | 6,378 | | 0.7 | 1.6 | 1.5 | |
| කාම්බෝජය | 1,527 | 1,767 | 4,188 | | 4.6 | 5.1 | 11.4 | |
| තායිලන්තය | 33,125 | 30,997 | 56,662 | | 6.5 | 6.2 | 11.2 | |
| වියට්නාමය | 7,006 | 6,290 | 19,594 | | 2.3 | 1.8 | 5.3 | |
| විදේශ සෘජු ආයෝජන ගලා ඒම | 2018 | 2020 | 2023 | | 2018 | 2020 | 2023 | |
| ශ්‍රී ලංකාව | 1,614 | 434 | 712 | | 1.9 | 0.5 | 0.8 | |
| බංග්ලාදේශය | 3,613 | 2,564 | 3,004 | | 0.8 | 0.7 | 0.7 | |
| කාම්බෝජය | 3,213 | 3,625 | 3,959 | | 7.6 | 10.4 | 9.4 | |

| | ඇ.ඩො. මිලියන | | | දළ දේශීය නිෂ්පාදිතයෙන් % | | |
|---|---|---|---|---|---|---|
| තායිලන්තය | 11 ,705 | -6,284 | 4,548 | 2.3 | -1.3 | 0.9 |
| වියට්නාමය | 15 ,500 | 15 ,800 | 18 ,500 | 3.6 | 4.6 | 4.3 |
| ආගමන සංචාරක වියදම්* | 2018 | 2020 | 2022 or හෝ නවතම** | 2018 | 2020 | 2022 or හෝ නවතම** |
| ශ්‍රී ලංකාව | 5,608 | 1, 076 | 1, 357 | 5.9 | 1. 3 | 1. 8 |
| බංග්ලාදේශය | 357 | 218 | 420 | 0.1 | 0.1 | 0.1 |
| කාම්බෝජය | 4,832 | 1,1 19 | 1, 529 | 1. 4 | 0.4 | 0.4 |
| තායිලන්තය | 61, 383 | 14 ,573 | 16 ,492 | 12.1 | 2.9 | 3.3 |
| වියට්නාමය | 10,080 | 3, 232 | 149 | 3.3 | 0.9 | 0.04 |

* ආගමන සංචාරක වියදම් ලෙස අර්ථ දැක්වෙන්නේ අදාළ රටට පැමිණි ආගන්තුකයෙකු සිදුකළ වියදම්ය.
** වියට්නාමය සඳහා නවතම සංචාරක වියදම් 2021 වසර වන විට පැවති දත්ත වේ.
මූලාශ: UNCTAD දත්ත පද්ධතියෙන් භාණ්ඩ හා සේවා අපනයනය සහ විදේශ සෘජු ආයෝජන ගලා ඒම පිළිබඳ දත්ත, එක්සත් ජාතීන්ගේ සංචාරක දත්ත පද්ධතියෙන්, ආගමන සංචාරක වියදම් පිළිබඳ දත්ත සහ ලෝක බැංකුවෙන් 2018, 2022, 2023 සඳහා වන වත්මන් දළ දේශීය නිෂ්පාදිතය පිළිබඳ දත්ත සහ 2025 අප්‍රේල් මාසයේ IMF ලෝක ආර්ථික දැක්ම වෙතින් 2024 සඳහා වත්මන් දළ දේශීය නිෂ්පාදිතය පිළිබඳ ඇස්තමේන්තුව ලබාගෙන, එම අගයන් මත කතුවරුන්ගේ ගණනය කිරීම් ද සමග යොදා ඇත.

# උපග්‍රන්ථය 2
# ව්‍යාපෘති අධීක්ෂණය පිළිබද යහපත් භාවිතාවන්

අධීක්ෂණය යනු කාර්යසාධනය සක්‍රියව කළමනාකරණය කිරීම, ධනාත්මක බලපෑම් උපරිම කිරීම සහ අහිතකර බලපෑම් ඇතිවීමේ අවදානම අවම කිරීම සඳහා තොරතුරු වරින් වර රැස් කිරීම, විශ්ලේෂණය කිරීම සහ භාවිතා කිරීම සඳහා වන ක්‍රියාවලියකි. වෙනත් වචන වලින් කිවහොත්, එය එහි පූර්ව නිශ්චිත ඉලක්ක, අරමුණු සහ කාලරාමුවලට සාපේක්ෂව ව්‍යාපෘති ප්‍රගතිය පිරික්සීම, මැනීම සහ ඇගයීම සඳහා වන අඛණ්ඩ ක්‍රියාවලියකි.

.

- ප්‍රගතිය පිරික්සීම: ව්‍යාපෘති ක්‍රියාකාරකම්, එහි සන්ධිස්ථාන සහ ඉටුකළ යුතු කාර්යන් පිළිබඳ දත්ත රැස් කිරීම.
- මැනීම: ස්ථාපිත සැසඳීම් මිණුම් වලට අනුකූලව කාර්ය සාධනය තක්සේරු කිරීම සඳහා, එකතුකරන ලද දත්ත විශ්ලේෂණය කිරීම.
- ඇගයීම: විභව ගැටළු හඳුනා ගැනීම සහ නිවැරදි කිරීමේ නිර්දේශ කිරීම සඳහා දත්ත විශ්ලේෂණයෙන් නිගමන උකහා ගැනීම.

## අධීක්ෂණයේ වැදගත්කම

අධීක්ෂණය ඵලදායී කළමනාකරණයේ වැදගත් අංගයකි, මන්ද එමඟින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහාය වන ආරම්භක හා වත්මන් තොරතුරු පූර්ව ඇගයීමේදීම ලබාදිය හැකිවීමයි. මෙය තවදුරටත් පහත පරිදි විස්තර කළ හැකිය.

- ගැටළු කලින් හඳුනා ගැනීම: කල් ඇතිව ගැටළු විසඳීම සහ අවදානම් අවම කිරීම.
- වැඩිදියුණු කළ තීරණ ගැනීම: සැලසුම් සහ සම්පත් වෙන්කිරීම සඳහා අදාල තොරතුරු මත ගැලපීම් සිදුකිරීම.
- වැඩිදියුණු කළ සන්නිවේදනය: පාර්ශවකරුවන්ට පැහැදිලි සහ කාලෝචිත යාවත්කාලීන කිරීම්.

- වැඩි වගවීම: ප්‍රගතිය පිරික්සීම සහ වගකීම සහතික කිරීම.
- වැඩිදියුණු කළ ව්‍යාපෘති ප්‍රතිඵල: වෙන්කළ අයවැය තුළ සහ කාලසටහනට අනුව ව්‍යාපෘති ඉලක්ක සපුරා ගැනීමේ වැඩි සම්භාවිතාව.

## ප්‍රධාන ක්ෂේත්‍ර නිරීක්ෂණය කිරීම

ප්‍රධාන කාර්ය සාධන ක්ෂේත්‍ර යනු සංවිධානයක, කණ්ඩායමක හෝ ව්‍යාපෘතියක සාර්ථකත්වය සඳහා අවශ්‍ය විශේෂිත අංග වේ. ප්‍රධාන කාර්ය සාධන ක්ෂේත්‍ර නිර්වචනය කිරීම මඟින් අවධානය පෙළගැස්වීම, සම්පත් වෙන් කිරීම පමණක් නොව, වගදායිතාව හා කාර්ය සාධනය වැඩි කිරීම සඳහා මැනිය හැකි ඉලක්ක සැකසීමටද උපකාරී වේ. මෙය තවදුරටත් පහත පරිදි විස්තර කළ හැකිය;

- විෂය පථය: ව්‍යාපෘතිය අර්ථ දක්වා ඇති සීමාවන් තුළ පවතින බව සහතික කිරීම.
- කාලසටහන: නියමිත දිනට අදාළව ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සහ විභව ප්‍රමාදයන් හඳුනා ගැනීම.
- අයවැය: වියදම් අධීක්ෂණය කිරීම සහ ඒවායේ ඉලක්ක සපුරාලීම සහතික කිරීම.
- ගුණාත්මකභාවය: ප්‍රතිඵලවල ගුණාත්මකභාවය තක්සේරු කිරීම සහ ඒවායේ ඉලක්ක සපුරාලීම සහතික කිරීම.
- අවදානම්: ව්‍යාපෘති සාර්ථකත්වයට ඇති විය හැකි බාධා හඳුනා ගැනීම සහ අවම කිරීම.
- පාර්ශ්වකරුවන්ගේ සන්නිවේදනය: සියලුම පාර්ශ්වකරුවන් සමඟ විවෘත හා වගදායී සන්නිවේදනයක් පවත්වා ගැනීම.

## අධීක්ෂණ ක්‍රම

අධීක්ෂණය යනු විවිධ ක්ෂේත්‍රවල ව්‍යාපෘති කළමනාකරණය, පර්යේෂණ, ක්‍රියාකාරකම් සහ ප්‍රතිඵල ක්‍රමානුකූලව නිරීක්ෂණය කිරීමට අවශ්‍ය වන තීරණාත්මක අංගයකි. ව්‍යාපෘතියක් හෝ වැඩසටහනක් එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නිසි මාර්ගයේ ගමන් කරන බව සහතික කිරීම සඳහා නිතිපතා තොරතුරු රැස් කිරීම, විශ්ලේෂණය කිරීම සහ භාවිතා කිරීම එයට ඇතුළත් වේ. විවිධ වර්ගයේ අධීක්ෂණ ක්‍රම විවිධ අරමුණු සඳහා ඉවහල් වන අතර, ඒ සෑම එකක්ම ඵලදායී තීරණ ගැනීමක් ඇති කළ හැකි මනා අවබෝධයක් සහ දත්ත සපයයි. ප්‍රධාන අධීක්ෂණ ක්‍රම පහත දැක්වේ,

- නිත්‍ය රැස්වීම්: ව්‍යාපෘති තත්ව රැස්වීම්, මෙහෙයුම් කමිටු රැස්වීම්.
- ප්‍රගති වාර්තා: ලිඛිත වාර්තා සහ අනෙකුත් ඉදිරිපත් කිරීම්.
- ප්‍රධාන කාර්ය සාධන දර්ශක: ව්‍යාපෘති කාර්ය සාධනය මනින ප්‍රධාන මිනුම්.
- ගැටළු හඳුනාගැනීමේ පද්ධති: ගැටළු හඳුනා ගැනීම සහ විසඳීම සඳහා ක්‍රම.
- අවදානම් ලේඛන: ව්‍යාපෘති අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ අවම කිරීම සඳහා මෙවලම්.

## යහපත් භාවිතාවන්

ඕනෑම ව්‍යාපෘතියක හෝ වැඩසටහනක සාර්ථකත්වය සහතික කිරීම සදහා සාර්ථක අධීක්ෂණ සහ ඇගයීම් සම්බන්ධ යහපත් භාවිතාවන් අත්‍යවශ්‍ය වේ. අධීක්ෂණ සහ ඇගයීමේ ක්‍රියාවලිය, අවධානය යොමු කළ යුතු ඕනෑම ක්ෂේත්‍රයක් හෝ අපේක්ෂිත ප්‍රතිඵල සපුරාලීම සහතික කිරීම සඳහා කළ යුතු වෙනස්කම් ඉස්මතු කිරීමට උපකාරී වේ. එපමණක් නොව, ඵලදායී අධීක්ෂණ සහ ඇගයීම් ක්‍රියාවලියක් මඟින් තීරණ ගැනීම සඳහා වඩාත් නිවැරදි හා කාලෝචිත දත්ත සැපයිය හැකිය.

මෙම යහපත් භාවිතාවන් අනුගමනය කිරීමෙන්, අධීක්ෂණ සහ ඇගයීම් ක්‍රියාවලියේ සාර්ථක බව සහතික කරගත හැකි අතර ඉලක්ක කරා ළඟා වීමට විශාල සහයෝගයක් ද ලැබෙයි. මෙම භාවිතාවන්ට ඇතුළත් වන්නේ:

- පැහැදිලි අධීක්ෂණ සැලැස්මක් ස්ථාපිත කිරීම: නිරීක්ෂණය කළ යුතු දේ, නිරීක්ෂණය කරන්නේ කෙසේද සහ වගකිව යුතු අය කවුරුන්ද යන්න නිර්වචනය කිරීම.
- දත්ත මත පදනම් වූ ප්‍රවේශයක් භාවිතා කිරීම: තීරණ ගැනීම සඳහා විෂයමූලිකව දත්ත රැස් කර විශ්ලේෂණය කිරීම.
- නිතිපතා සමාලෝචනය කර නිසි ගැලපුම් සිදුකිරීම: ප්‍රතිපෝෂණ සහ උගත් පාඩම් මත පදනම්ව අධීක්ෂණ ක්‍රියාවලිය අඛණ්ඩව ශක්තිමත් කිරීම.
- පාර්ශවකරුවන් සම්බන්ධ කරගැනීම: අධීක්ෂණ ක්‍රියාවලිය පුරාම පාර්ශවකරුවන් දැනුවත් කර සම්බන්ධ කරගැනීම.
- අඛණ්ඩ වැඩිදියුණු කිරීම් කෙරෙහි අවධානය යොමු කිරීම: වැඩිදියුණුව සඳහා ක්ෂේත්‍ර හඳුනාගැනීමට සහ අනාගත ව්‍යාපෘති ශක්තිමත් කිරීමට අධීක්ෂණ දත්ත භාවිතා කිරීම.

ODI, ස්වාධීන සහ ගෝලීය සබඳතා සහිත චින්තන පර්ෂදයක් වන අතර, අයුක්තියට සහ අසමානතාවයට එරෙහිව ක්‍රියා කිරීමට ජනතාව උද්‍යෝගිමත් කරයි. එමෙන්ම, පර්යේෂණ, සමුළු සහ සාධනීය බලපෑම් ක්‍රියාකාරකම් හරහා, පුද්ගලයින් සහ ලෝකය වෙත නව අදහස් උත්පාදනය කිරීමට කටයුතු කරයි.

ශ්‍රී ලංකාව සන්ධිස්ථානයක සිටී. නිදහසින් පසු ඇති වූ දරුණුතම ආර්ථික අර්බුදයෙන් ගොඩ එමින් පවතින රට, පරිවර්තනීය ආර්ථික වර්ධනයක් ඇති කරගැනීමේ සහ උත්සාහයකින් දිනාගත් සාර්ව ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගැනීමේ ද්විත්ව අභියෝගයට මුහුණ දෙයි. ODI Global සහ දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ (CEPA) සහයෝගීතාවයෙන් ඉදිරිපත් කෙරෙන මෙම වාර්තාව, මෙම සංකීර්ණ තත්වයෙන් ගොඩ ඒම සඳහා තීරණාත්මක මාර්ගෝපදේශයක් ඉදිරිපත් කරයි. මෑත කාලීන ස්ථාවරකරණ උත්සාහයන් ආර්ථික වර්ධන ප්‍රවණතාවයක් සහ අඩු උද්ධමනය ඇතුළු ධනාත්මක ප්‍රතිඵල ලබා දී ඇතත්, දරිද්‍රතා මට්ටම් වඩා ඉහළ ලෙස ඉහළ මට්ටමක පවතී. අනාගත අර්බුද වළක්වා ගැනීමට සහ ශ්‍රී ලංකාවේ දැවැන්ත විභවය විවෘත කිරීමට අඛණ්ඩ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ අත්‍යවශ්‍ය බව මෙම අධ්‍යයනය තර්ක කරයි. ප්‍රධාන ප්‍රතිපත්ති ක්ෂේත්‍ර හයක් - සාර්ව ආර්ථික ස්ථාවරත්වය, ගෝලීය සැපයුම් දාම ඒකාබද්ධ කිරීම, වැඩිදියුණු කළ සාධක වෙළඳපොළවල්, ඉලක්කගත ආංශික ප්‍රතිපත්ති, දරිද්‍රතාව අඩු කිරීම සහ ඒකාග්‍රතාව ගොඩනැගීම කෙරෙහි අවධානය යොමු කර ඇත. ශ්‍රී ලංකාවට 2025 සහ 2030 අතර කාලය තුළ තිරසාර හා සියල්ල ඇතුළත් වර්ධනයක් අත්කර ගැනීම සඳහා සංචාරක ව්‍යාපාරය, ඩිජිටල් ආර්ථිකය, නිකේතන නිෂ්පාදනය සහ කෘෂිකර්මාන්තය යන ක්ෂේත්‍රවල අවස්ථා ප්‍රයෝජනයට ගත හැකිය.

**ODI Global**
203 බ්ලැක්ෆයර්ස් පාර
ලන්ඩනය SE1 8NJ
එක්සත් රාජධානිය

odi.org
LinkedIn: ODI Trade and Economic Development